# 7

# මුදල් ප්‍රතිපත්තිය, පොලී අනුපාතික, මුදල් සහ ණය

## 7.1 සමස්ත නිරීක්ෂණ

*ව්‍යාපාර සහ පුද්ගලයින්ට සැලකිය යුතු ලෙස අභියෝග එල්ල කළ කොවිඩ්-19 වසංගතය හමුවේ, ආර්ථික වර්ධනය, ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත් කිරීම සහ ස්ථායීතාව අරමුණු කර ගත් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් යටතේ, ශ්‍රී ලංකා මහ බැංකුව මුදල් තත්ත්වයන් පෙර නොවූ මට්ටමකට ලිහිල් කිරීමේ පියවර ගණනාවක් 2020 වසරේ දී ක්‍රියාවට නැංවීය. මනාව පාලනය වූ උද්ධමන අපේක්ෂා සහ ආර්ථිකයේ අඩු සමස්ත ඉල්ලුම මෙන්ම, අත්‍යවශ්‍ය නොවන ආනයන සහ ආයෝජන ගලා යෑම් සඳහා පනවා ඇති සීමාවන් හමුවේ, මතුපිට සහ මූලික උද්ධමනය අඩු මට්ටම්වල පැවතීම හේතුවෙන්, දේශීය ආයෝජන ඉහළ නැංවීමේ අරමුණෙන් 2020 වසරේ දී විශාල ලෙස මුදල් ලිහිල්කරණය සිදු කිරීමට හැකි විය. 2020 වසරේ දී, අනෙකුත් ප්‍රධාන ප්‍රතිපත්තිමය වෙනස්කම් සමඟ, ප්‍රතිපත්ති පොලී අනුපාතික අවස්ථා පහක දී පදනම් අංක 250කින්, බලපත්‍රලාභී වාණිජ බැංකුවල සියලුම රුපියල් තැන්පතු වගකීම් සඳහා අදාළ වන ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය අවස්ථා දෙකක දී ප්‍රතිශතාංක 3කින් සහ බැංකු අනුපාතිකය පදනම් අංක 650කින් අඩු කෙරිණි. ශ්‍රී ලංකා මහ බැංකුව වසර මුළුල්ලේම රජයට අවශ්‍ය අරමුදල් සැපයූ අතර, එය වෙළඳපොළ ද්‍රවශීලතාව ඉහළ නැංවීමට ද දායක විය. තවද, ශ්‍රී ලංකා මහ බැංකුව කොවිඩ්-19 වසංගතයෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාරවල කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා ඉතා සහනදායී ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කළ අතර, ඉතා ඉහළ අගයක පැවති ඇතැම් ණය පොලී අනුපාතික අඩු කිරීමට ඉලක්කගත ක්‍රියාමාර්ග ගැනීමත්, දේපළ ඇපකර සහිත නිවාස ණය සඳහා උපරිම පොලී අනුපාතික පැනවීමත් සිදු කෙරිණි. මෙම පියවරවල ප්‍රතිඵලයක් ලෙස, ආර්ථිකයේ සමස්ත පොලී අනුපාතික ව්‍යුහය පහළ ගිය අතර, ඇතැම් වෙළඳපොළ පොලී අනුපාතික මෙතෙක් වාර්තා වූ අවම අගයන් කරා ළඟා විය. මෙම ප්‍රවණතා සමඟ, 2020 වසරේ අග භාගය වන විට, පෞද්ගලික අංශය සඳහා සපයන ලද සමස්ත ණය ප්‍රසාරණයේ ඉහළ යෑමක් දක්නට ලැබුණු අතර, වසර මුළුල්ලේම රාජ්‍ය අංශය වෙත ලබා දුන් ණය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස, පුළුල් මුදල් සැපයුම ශීඝ්‍ර ලෙස ප්‍රසාරණය විය.*

## 7.2 ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය

අඩු උද්ධමනය සහ මනාව පාලනය වූ උද්ධමන **අපේක්ෂා සමඟ ආර්ථික වර්ධනය, ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත් කිරීම සහ ස්ථායීතාව ළඟා කර ගැනීමේ අරමුණින්, ශ්‍රී ලංකා මහ බැංකුව 2020 වසර මුළුල්ලේම ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් පවත්වා ගෙන ගියේය.** කොවිඩ්-19 ව්‍යාප්තිය සහ එය පාලනය කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග හේතුවෙන් ආර්ථික කටයුතු අඩාල වූ අතර, ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම සඳහා සහාය වීමට ශ්‍රී ලංකා මහ බැංකුවට ඉතා ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් පවත්වා ගෙන යෑමට අවශ්‍ය විය. ඒ අනුව, 2019 මැයි මස ඇරඹුණු මුදල් ලිහිල්කරණ චක්‍රය 2020 වසරේ දී ද අඛණ්ඩව ක්‍රියාත්මක කරමින්, ප්‍රතිපත්ති පොලී අනුපාතික සහ බලපත්‍රලාභී වාණිජ බැංකුවල සියලුම රුපියල් තැන්පතු වගකීම් සඳහා අදාළ වන ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සැලකිය යුතු ලෙස පහළ දැමීය. ශ්‍රී ලංකා මහ බැංකුව 2020 වසරේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 250කින් සහ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ප්‍රතිශතාංක 3කින් අඩු කරන ලදී. 2020 ජනවාරි මාසයේ දී, ශ්‍රී ලංකා මහ බැංකුව සිය ප්‍රතිපත්ති පොලී අනුපාතික වන නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, පිළිවෙලින්, සියයට 6.50ක් සහ 7.50ක් දක්වා පදනම් අංක 50කින් අඩු කරන ලදී. 2020 මාර්තු මාසයේ සිට රට තුළ කොවිඩ්-19 වසංගතය පැතිරීමත් සමඟ, ශ්‍රී ලංකා මහ බැංකුව, අරමුදල් පිරිවැය තවදුරටත් අඩු කිරීම, දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව ඉහළ නැංවීම සහ ඉදිරි කාලපරිච්ඡේදයේ දී ලිහිල් ප්‍රතිපත්ති ස්ථාවරයක් පවත්වා ගෙන යෑමට වන කැපවීම දැනුම් දීම අරමුණු කර ගත් පියවර දාමයක් හරහා වෙළඳපොළ තුළ විශ්වාසය පවත්වා ගෙන යෑමට යුහුසුලුව ක්‍රියා කළේය. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව 2020 මාර්තු සහ මැයි මාස අතර කාලය තුළ මුදල් ප්‍රතිපත්ති සමාලෝචන ත්‍රිත්වයක දී ප්‍රතිපත්ති පොලී අනුපාතික තවදුරටත් පදනම් අංක 100කින් අඩු කළේය. තවද, මූල්‍ය ආයතනවල මුදල් ප්‍රවාහ ලැබීම් අඩාල වීම සහ හදිසි අරමුදල් අවශ්‍යතා හේතුවෙන් ඇති වූ ඉහළ අවිනිශ්චිතතා මධ්‍යයේ මුදල් වෙළඳපොළෙහි ද්‍රවශීලතාව ඉහළ නැංවීම සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව 2020 මාර්තු මාසයේ දී ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ප්‍රතිශතාංක 1කින් ද, 2020 ජූනි මාසයේ දී නැවතත් ප්‍රතිශතාංක 2කින් ද අඩු කළ අතර, එමගින් මුදල් වෙළඳපොළට රුපියල් බිලියන 180ක පමණ අමතර ද්‍රවශීලතාවක් ලබා දෙන ලදී. තවද, කොවිඩ්-19 වසංගතයෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාරවලට අඩු පොලී අනුපාතික යටතේ කාරක

**7.1 සංඛ්‍යා සටහන**

**මෑත කාලීන මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග**

| දිනය | ක්‍රියාමාර්ගය |
|---|---|
| 2016 පෙබරවාරි 19 | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 50කින්, පිළිවෙළින්, 6.50% සහ 8.00% දක්වා ඉහළ නංවන ලදී. |
| 2016 ජූලි 28 | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 50කින්, පිළිවෙළින්, 7.00% සහ 8.50% දක්වා ඉහළ නංවන ලදී. |
| 2017 මාර්තු 24 | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 25කින්, පිළිවෙළින්, 7.25% සහ 8.75% දක්වා ඉහළ නංවන ලදී. |
| 2018 අප්‍රේල් 04 | නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 25කින් 8.50% දක්වා අඩු කරන ලදි. ඒ අනුව, නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවේ පරාසය පදනම් අංක 150 සිට පදනම් අංක 125 දක්වා අඩු කරන ලදි. |
| 2018 නොවැම්බර් 14 | 2018 නොවැම්බර් මස 16 වැනි දින සිට ඇරඹෙන සංචිත කාලපරිච්ඡේදයේ සිට බලපැවැත්වෙන පරිදි ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ප්‍රතිශතාංක 1.50කින් 6.00% දක්වා අඩු කරන ලදි. නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය පදනම් අංක 75කින්, 8.00% ක් දක්වා සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 50කින් 9.00% දක්වා ඉහළ නංවන ලදි. ඒ අනුව නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවේ පරාසය පදනම් අංක 125 සිට පදනම් අංක 100 දක්වා අඩු කරන ලදි. |
| 2019 පෙබරවාරි 22 | 2019 මාර්තු මස 01 වැනි දින සිට ඇරඹෙන සංචිත කාලපරිච්ඡේදයේ සිට බලපැවැත්වෙන පරිදි ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ප්‍රතිශතාංක 1.00කින් 5.00% දක්වා අඩු කරන ලදි. |
| 2019 මැයි 31 | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 50කින්, පිළිවෙළින්, 7.50% සහ 8.50% දක්වා අඩු කරන ලදී. |
| 2019 අගෝස්තු 23 | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 50කින්, පිළිවෙළින්, 7.00% සහ 8.00% දක්වා අඩු කරන ලදී. |
| 2020 ජනවාරි 30 | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 50කින්, පිළිවෙළින්, 6.50% සහ 7.50% දක්වා අඩු කරන ලදී. |
| 2020 මාර්තු 17 | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 25කින්, පිළිවෙළින්, 6.25% සහ 7.25% දක්වා අඩු කරන ලදී. |
| 2020 මාර්තු 17 | 2020 මාර්තු මස 16 වැනි දින සිට ඇරඹෙන සංචිත කාලපරිච්ඡේදයේ සිට බලපැවැත්වෙන පරිදි ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ප්‍රතිශතාංක 1.00කින් 4.00% දක්වා අඩු කරන ලදී. |
| 2020 මාර්තු 27 | කොවිඩ්-19 වසංගතයෙන් පීඩාවට පත් වූ ව්‍යාපාර සඳහා 4.00% පොලී අනුපාතිකයක් යටතේ රුපියල් බිලියන 50 ක් දක්වා වූ සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම (ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමය - පළමු අදියර) හඳුන්වා දෙන ලදී. |
| 2020 අප්‍රේල් 03 | 2020 අප්‍රේල් මස 03 වැනි දින ව්‍යාපාර කටයුතු අවසාන වන අවස්ථාවේ සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 25කින්, පිළිවෙළින්, 6.00% සහ 7.00% දක්වා අඩු කරන ලදී. |
| 2020 අප්‍රේල් 16 | බැංකු අනුපාතිකය පදනම් අංක 500කින් 10.00% දක්වා අඩු කරනු ලැබූ අතර, එය පදනම් අංක +300 ආන්තිකයක් සහිතව නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය හා අනුකූලව ස්වයංක්‍රීයව ගැළපීම සඳහා ඉඩ හරින ලදී. |
| 2020 මැයි 06 | 2020 මැයි 06 වැනි දින ව්‍යාපාර කටයුතු අවසාන වන අවස්ථාවේ සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 50කින්, පිළිවෙළින්, 5.50% සහ 6.50% දක්වා අඩුකරන ලදී. බැංකු අනුපාතිකය ස්වයංක්‍රීයව 9.50% දක්වා අඩු විය. |
| 2020 ජූනි 16 | 2020 ජූනි මස 16 වැනි දින සිට ඇරඹෙන සංචිත කාලපරිච්ඡේදයේ සිට බලපැවැත්වෙන පරිදි ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ප්‍රතිශතාංක 2.00කින්, 2.00% දක්වා අඩු කරන ලදී |
| 2020 ජූනි 16 | කොවිඩ්-19 වසංගතයෙන් පීඩාවට පත් වූ ව්‍යාපාර සඳහා 2020 මාර්තු 27 හඳුන්වාදුන් 4.00% පොලී අනුපාතිකයක් යටතේ ලබාදුන් සහන ණය පහසුකම, රුපියල් බිලියන 150ක් දක්වා ඉහළ නංවන ලදී (සෞභාග්‍යා පුනරුද සහන ණය පහසුකම - දෙවන අදියර). |
| 2020 ජූලි 09 | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 100කින්, පිළිවෙළින්, 4.50% සහ 5.50% දක්වා අඩු කරන ලදී. බැංකු අනුපාතිකය ස්වයංක්‍රීයව 8.50% දක්වා අඩු විය. |


සටහන: මහ බැංකුව විසින් පහත පරිදි පොලී අනුපාතික මත උපරිම සීමා පනවන ලදී.

- 2019.04.26: බලපත්‍රලාභී බැංකුව හා බැංකු නොවන මූල්‍ය ආයතනවල තැන්පතු උපකරණ මත උපරිම පොලී අනුපාතික සීමා පනවන ලදී.
- 2019.09.24: බලපත්‍රලාභී බැංකුවල ණය පොලී අනුපාතික මත උපරිම සීමා පැනවූ අතර, තැන්පතු පොලී අනුපාතික මත පනවා තිබූ උපරිම සීමා ඉවත් කරන ලදී.
- 2020.04.27: බලපත්‍රලාභී බැංකුවල උකස් පහසුකම් මත උපරිම පොලී අනුපාතික සීමා පනවන ලදී.
- 2020.08.24: තෝරා ගත් ණය උපකරණ මත පනවා තිබූ උපරිම පොලී අනුපාතික සීමා තවදුරටත් අඩු කරන ලදී.
- 2020.11.26: දේපළ ඇපකර සහිත නිවාස ණය සඳහා උපරිම පොලී අනුපාතික හඳුන්වා දෙන ලදී.
- 2021.01.19: බැංකු ප්‍රජාව සමඟ සාකච්ඡා කර, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (MSME) අංශයෙහි ප්‍රමුඛ අංශවලට ණය ලබා දීමේ ඉලක්ක හඳුන්වා දීමට තීරණය කරන ලදී.


මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**7.1 රූප සටහන**

**මුදල් අංශයේ කාර්යසාධනය**



**7.2 රූප සටහන**
**නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සහ බැංකු අනුපාතිකය**



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රාග්ධන ණය ලබා දීම සඳහා බලපත්‍රලාභී බැංකුවලට හැකි වන පරිදි, ශ්‍රී ලංකා මහ බැංකුව සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන පහසුකම යටතේ සහනදායී ණය යෝජනා ක්‍රම හඳුන්වා දෙන ලදී. 2020 වසරේ මැද වන විට ප්‍රතිපත්ති පොලී අනුපාතික සහ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය පහළ දැමීම හමුවේ වුව ද, ණය අනුපාතිකවල අඩු වීම මන්දගාමීව පැවතුණි. එබැවින්, 2020 ජූලි මාසයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව සිය ප්‍රතිපත්ති පොලී අනුපාතික වන නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, ඒවායේ අවම මට්ටම් වූ, පිළිවෙලින්, සියයට 4.50 සහ සියයට 5.50ක් දක්වා පදනම් අංක 100කින් තවදුරටත් අඩු කළේය. මේ අතර, මූල්‍ය අංශයට හදිසි අරමුදල් අඩු පිරිවැයකින් ලබා ගත හැකි බව දක්වමින්, ශ්‍රී ලංකා මහ බැංකුව 2020 අප්‍රේල් මාසයේ දී බැංකු අනුපාතිකය පදනම් අංක 500කින් අඩු කළ අතර, එය නිත්‍ය ණය පහසුකම් අනුපාතිකයට වඩා පදනම් අංක 300ක ආන්තිකයක් සහිතව ස්වයංක්‍රීයව ගැළපීමට ඉඩ සලසන ලදී. ඒ අනුව, 2020 වසර අවසානය වන විට බැංකු අනුපාතිකය සියයට 8.50ක් දක්වා පදනම් අංක 650කින් අඩු විය. මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණ ක්‍රියාවලිය කඩිනම් කිරීමට සහ ආන්තික ණය ගැනුම්කරුවන්ට සහාය වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව 2020 අගෝස්තු මාසයේ දී ණය කාඩ්පත්, උකස් පහසුකම්, පෙර ගිවිස ගෙන ඇති තාවකාලික බැංකු අයිරා මෙන්ම, දඩ පොලී අනුපාතික සඳහා අය කළ ඉතා ඉහළ පොලී අනුපාතික පහළ දැමීම සඳහා තවදුරටත් නියාමන ක්‍රියාමාර්ග අනුගමනය කළේය. දීර්ඝ කාලයක් මුළුල්ලේ අඩු මට්ටමක පැවති දේශීය ආයෝජන ප්‍රවර්ධනය කිරීම මෙන්ම, වසංගතයෙන් බලපෑමට ලක් වූ ආර්ථිකයට වේගවත්ව ඉහළ වර්ධන මාවතකට නැවත යොමු වීම සඳහා සහාය වීම, සමස්තයක් ලෙස මෙම මුදල් ප්‍රතිපත්ති සහ මුදල් තත්ත්වයන් ලිහිල් කිරීමේ ක්‍රියාමාර්ගවල අරමුණ විය. වසංගතය හේතුවෙන් රජයේ මුදල් ප්‍රවාහවලට ඇති වූ බාධාවන් සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රාථමික වෙළෙඳපොළෙන් භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම හරහා රජයට අවශ්‍ය මූල්‍යමය සහාය ලබා දුන්නේය. මෙය වෙළෙඳපොළ ද්‍රවශීලතාව ඉහළ නැංවීමට සහ රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික අඩු කිරීමට උපකාරී වූ අතර, ප්‍රාථමික වෙන්දේසිවල ලංසු පිළිගැනීම සඳහා උපරිම ඵලදා අනුපාතික පැනවීම ද ඵලදා අනුපාතික අඩු වීමට සහාය විය. ඵලදා අනුපාතික අඩුවීම මගින් මෙම කාලය තුළ රජයේ මූල්‍ය පිරිවැය සැලකිය යුතු ලෙස අඩු වීමට හේතු විය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා මහ බැංකුව සතු රජයේ සුරැකුම්පත් තොගය සැලකිය යුතු ලෙස ඉහළ යෑම හරහා අනාගතයේ දී උද්ධමනකාරී පීඩන ඇති විය හැකි බව පිළිබිඹු කරන අතර, එබැවින් සමස්ත ඉල්ලුම් තත්ත්ව තිරසාර පදනමින් සාමාන්‍ය තත්ත්වයට පත් වූ පසු, මෙම මූල්‍ය උත්තේජක සැපයීම කාලානුරූපීව අඩු කර ගැනීම අවශ්‍ය වේ. මේ අතර, කොවිඩ්-19 වසංගතයෙහි දෙවන රැල්ලෙන් පසුව ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව තවදුරටත් පියවර ක්‍රියාත්මක කළේය. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව වැටුප්ලාභී සේවානියුක්තිකයන් හට අවම වශයෙන් අවුරුදු පහක ණය කාලයක දේපළ ඇපකර සහිත නිවාස ණය සඳහා වසරකට සියයට 7ක උපරිම පොලී අනුපාතිකයක් හඳුන්වා දෙන ලදී. ප්‍රතිපත්තිමය සහ නියාමන ක්‍රියාමාර්ගවල බලපෑම පිළිබිඹු කරමින්, වෙළෙඳපොළ ණය පොලී අනුපාතික 2020 වසර තුළ දී සැලකිය යුතු ලෙස අඩු විය. ණය අනුපාතික අඩු වීම සහ වැඩි දියුණු වූ වෙළෙඳපොළ අපේක්ෂා සමඟ, 2020 අගෝස්තු මාසයේ සිට පෞද්ගලික අංශයට සපයන ලද ණයෙහි වර්ධනයක් පෙන්නුම් කළේය. කෙසේ වෙතත්, එවැනි ණයවලින් බොහොමයක් පෞද්ගලික ණය සහ අත්තිකාරම් ලෙස වූ හෙයින්, ශ්‍රී ලංකා මහ බැංකුව 2021 ජනවාරි මාසයේ දී බැංකු සඳහා ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයෙහි ප්‍රමුඛ අංශවලට ණය ලබා දීමේ ඉලක්ක හඳුන්වා දීම පිළිබඳව ප්‍රකාශයට පත් කරමින් ආර්ථිකයේ මූල්‍ය අවශ්‍යතා ඇති අංශවලට සහාය වීම සඳහා තවදුරටත් ක්‍රියාමාර්ග ගනු ලැබීය.


7

### විශේෂ සටහන 5
### ශ්‍රී ලංකා මහ බැංකුව 2020 වසරේ දී උපයෝගී කර ගත් මුදල් ප්‍රතිපත්ති උපකරණ

කොවිඩ්-19 වසංගතය මගින් ආර්ථිකය සහ මූල්‍ය වෙළඳපොළ මත මින් පෙර නොවූ බලපෑමක් ඇති කිරීම හේතුවෙන්, වසංගතය මගින් ඇති කෙරුණු මූල්‍ය අර්බුදයට පිළියම් යෙදීමට සහ එම ආර්ථිකයන්ට සහාය දැක්වීම සඳහා සුවිශේෂී පියවර ගැනීමට ලොව පුරා මහ බැංකු ක්‍රියා කරන ලදී. සාම්ප්‍රදායික මුදල් ප්‍රතිපත්ති උපකරණවලට අමතරව, බොහෝ මහ බැංකු විසින් ප්‍රමාණාත්මක ලිහිල්කරණය (Quantitative Easing), ඉලක්කගත ණය වැඩසටහන් සහ අඩු පොලී අනුපාතික පවත්වා ගැනීම සඳහා වූ ඉදිරි මාර්ගෝපදේශ (Forward Guidance) ඇතුළු සාම්ප්‍රදායික නොවන මුදල් ප්‍රතිපත්තීන් ද යොදා ගන්නා ලදී.

කොවිඩ්-19 ව්‍යාප්තිය හේතුවෙන් මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කළ ලොව ප්‍රථම මහ බැංකු අතරට එක් වෙමින්, ශ්‍රී ලංකා මහ බැංකුව ද 2020 වසරේ දී මුදල් ප්‍රතිපත්ති උපකරණ ගණනාවක් ක්‍රියාවේ යොදවන ලදී. වෙළඳපොළ තුළට ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් ලබා දීම සහ ණය ගැනීමේ පිරිවැය අඩු කිරීම ඉලක්ක කර ගත්, සාම්ප්‍රදායික නොවන ක්‍රියාමාර්ග ද ඇතුළත් වූ මෙම ප්‍රතිපත්ති, සුවිශේෂී වේගයකින්, ප්‍රමාණයකින් සහ පරිමාණයකින් යුතුව ක්‍රියාත්මක කෙරුණු අතර, මූල්‍ය වෙළඳපොළට සහ ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත් කිරීමට ඉන් සහාය හිමි විය. අඩු ඉල්ලුම් සහ අඩු උද්ධමන තත්ත්ව මෙවැනි පුළුල් මුදල් ප්‍රතිපත්ති උත්තේජනයන් සිදු කිරීම සඳහා

#### රූප සටහන වි.ස. 5.1
#### 2020 වසරේ දී මහ බැංකුව ක්‍රියාවට නැංවූ මුදල් ප්‍රතිපත්ති උපකරණ සහ ඒවායේ බලපෑම




7

අවශ්‍ය ප්‍රතිපත්තිමය අවකාශය ලබා දුණි. රජය විසින් සපයන ලද රාජ්‍ය මූල්‍ය උත්තේජන සහ මහ බැංකුව විසින් ගනු ලැබූ අනෙකුත් නියාමන හා මෙහෙයුම් ක්‍රියාමාර්ග රැසක් ද මෙම මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සඳහා සහාය විය.

ආර්ථික ක්‍රියාකාරකම් වේගවත්ව යථා තත්ත්වයට පත් වීම, දිගු කාලයක් පුරා පැවති අඩු ආර්ථික වර්ධනයෙන් පසු ඉහළ වර්ධන මාවතකට නැවත ළඟා වීම සහ සාර්ව ආර්ථික හා මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව පවත්වා ගැනීමට සහාය වීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින්, 2020 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුව සිය ප්‍රතිපත්ති පොලී අනුපාතික සැලකිය යුතු ලෙස ප්‍රතිශතාංක 2.50කින් අඩු කළ අතර, එමගින් ආර්ථිකයේ දේශීය ආයෝජන, නිෂ්පාදන සහ පරිභෝජනයට සහාය ලබා දීම සඳහා මූර්ත පොලී අනුපාතික පහළ හෙළීම ඔස්සේ ණය ගලා යෑම් ඉහළ නැංවීම අරමුණු විය. තවද, මූල්‍ය අංශයට අඩු පිරිවැයකට හදිසි අරමුදල් ලබා ගැනීමට ඇති හැකියාව දන්වා සිටීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2020 වසරේ දී බැංකු අනුපාතිකය ප්‍රතිශතාංක 6.50කින් අඩු කරන ලදී.

දේශීය මුදල් වෙළඳපොළෙහි ද්‍රවශීලතාව ඉහළ නැංවීමට සහ තම මුදල් ප්‍රවාහවලට ඇති වූ බාධා හේතුවෙන් පීඩාවට පත් වූ මූල්‍ය ආයතන, ව්‍යාපාර සහ පුද්ගලයින්ට සහාය වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ප්‍රතිශතාංක 3කින් අඩු කළ අතර, එමගින් 2020 වසරේ දී මුදල් වෙළඳපොළට රුපියල් බිලියන 180ක පමණ ද්‍රවශීලතාවක් කඩිනමින් නිදහස් කෙරිණි.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විවට වෙළඳපොළ කටයුතු (OMO) සිදු කිරීම තුළින් කෙටි කාලීන පොලී අනුපාතික අඩු මට්ටම්වල පවත්වා ගෙන යෑම සඳහා ක්‍රියා කළ අතර, මුදල් වෙළඳපොළ තුළ ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් පවත්වා ගන්නා ලදී. තවද, වසංගතයෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයින්ට සහාය වීමට, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2020 වසර තුළ දී ප්‍රාථමික වෙළඳපොළෙන් ශුද්ධ පදනම මත රුපියල් බිලියන 625ක පමණ භාණ්ඩාගාර බිල්පත් මිලදී ගනු ලැබීම හරහා රජයට හදිසි අරමුදල් ලබා දෙන ලදී. මෙය, දේශීය මුදල් වෙළඳපොළේ ද්‍රවශීලතාව ඉහළ නැංවීමටත් රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික ප්‍රතිශතාංක 2-3කින් පමණ අඩු කිරීමටත් උපකාරී විය.

වසංගතයෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාරවල කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගැනීමට අරමුදල් සැපයීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහනදායී ණය යෝජනා ක්‍රම (සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම යටතේ) ක්‍රියාත්මක කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙම යෝජනා ක්‍රම යටතේ වාර්ෂිකව සියයට 4ක සහන පොලී අනුපාතිකයකට සපයන ලද මුළු අරමුදල් ප්‍රමාණය රුපියල් බිලියන 180ක් පමණ වූ අතර, එමගින් ව්‍යාපාරවලට, විශේෂයෙන්ම ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ඉතා අසීරු අවස්ථාවේ දී අඛණ්ඩව ක්‍රියාත්මක වීමට සෘජුවම සහන සැපයිණි.

බැංකු සමග නිරන්තර සංවාදයක් පවත්වා ගනිමින්, මුදල් ප්‍රතිපත්ති අපේක්ෂාවන්ට අනුකූලව වෙළෙඳපොළ පොලී අනුපාතික අඩු කිරීම සඳහා වාණිජ බැංකු පෙළඹවීමට සහ වසංගතයෙන් බලපෑමට ලක් වූ ආයතන සඳහා අත්‍යවශ්‍ය ද්‍රවශීලතා සහාය ලබා දීමට බැංකුවලට බලපෑම් කිරීමට ද ශ්‍රී ලංකා මහ බැංකුව 2020 වසරේ දී ශිෂ්ට ප්‍රයෝග (Moral Suasion) අඛණ්ඩව අනුගමනය කළේය. පාස්කු ඉරිදා දින සිදු වූ ප්‍රහාරවලින් අනතුරුව ආර්ථික කටයුතුවලට සහන සැලසීම සහ වෙළඳපොළ ණය අනුපාතික අඛණ්ඩව අඩු කිරීම සහතික කිරීම සඳහා බැංකු ප්‍රජාව සමග සාකච්ඡා කර 2019 වසරේ සිට ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ද මෙම ප්‍රයත්නයේ සඵලදායීත්වයට දායක විය.

ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමේ ලකුණු පෙන්වන තෙක්, දැනට පවතින ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය පවත්වාගෙන යන බවට ආර්ථිකයේ පාර්ශ්වකරුවන් හට දැන්වීමේ උපකරණයක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉදිරි මාර්ගෝපදේශ ද භාවිතා කරන ලදී. නුදුරු අනාගතයේ දී පොලී අනුපාතික ඉහළ යා හැකි බවට ඇති විය හැකි අහිතකර වෙළඳපොළ අපේක්ෂා දුරු කිරීමට එවැනි මග පෙන්වීම් අතිශයින් වැදගත් විය. තවද, මෙමගින් වෙළඳපොළ පොලී අනුපාතික පහළ යෑම අඛණ්ඩව පවත්වා ගැනීමට උපකාරී වූ අතර, මැදි හා දිගු කාලීනව තනි අගයක පොලී අනුපාතික ව්‍යුහයක් පැවතීම සහතික කිරීම සඳහා සහාය වීමටත්, එමගින් දේශීය ආයෝජකයන් හට තිරසාර අඩු උද්ධමන වාතාවරණයෙහි ප්‍රතිලාභ ලබා දීමටත් හැකි වේ.

ශ්‍රී ලංකා මහ බැංකුව, ඇතැම් මූල්‍ය උපකරණ සඳහා පැවති ඉහළ පොලී අනුපාතික මත උපරිම සීමා පැනවීම හරහා ඉලක්කගත ක්‍රියාමාර්ග අනුගමනය කළ අතර, එමගින් මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණ යාන්ත්‍රණය ද වැඩි දියුණු විය. තවද, බලපත්‍රලාභී බැංකු සඳහා ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයෙහි ප්‍රමුඛ අංශවලට ණය ලබා දීමේ ඉලක්ක හඳුන්වා දීමට පියවර ගැනුණි.

කොවිඩ්-19 වසංගතය මධ්‍යයේ 2020 වසර මුළුල්ලේ ශ්‍රී ලංකා මහ බැංකුව ක්‍රියාවට නැංවූ මුදල් ප්‍රතිපත්ති මෙවලම් මාලාව මගින්, බෙහෙවින් අභියෝගාත්මක තත්ත්ව යටතේ මූල්‍ය අංශයේ ස්ථායීතාව පවත්වා ගැනීමට ද පහසුකම් සැලසිණි. මෙවැනි සුවිශේෂී මුදල් ලිහිල්කරණ මෙන්ම, රාජ්‍ය මූල්‍ය උත්තේජක ක්‍රියාමාර්ගවල සහායයෙන් ආර්ථිකය දැනටමත් ස්ථාවරව යථා තත්ත්වයට පත් වීමේ සලකුණු පෙන්නුම් කර ඇති අතර, ඉහළ වර්ධනයක් සඳහා අවශ්‍ය කෙරෙන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමත් සමග, දැනට පවතින අඩු පොලී අනුපාතික පරිසරය ආර්ථිකයට යළි ඉහළ වර්ධන මාවතකට ළඟා වීමට සහාය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.


7

තවද, ශ්‍රී ලංකා මහ බැංකුව 2021 වසරේ දී ලිහිල් මුදල් ප්‍රතිපත්තිය පවත්වා ගෙන යෑම පිළිබඳ ඉදිරි මාර්ගෝපදේශයක් වෙළඳපොළ වෙතට ලබා දුන් අතර, එමගින් නුදුරු කාලීනව පොලී අනුපාතික ඉහළ යෑම පිළිබඳ අපේක්ෂා දුරු කෙරිණි. අත්‍යවශ්‍ය නොවන ආනයන සහ වෙනත් විදේශ විනිමය ගෙවීම් මත පවත්නා සීමාවන් මගින් ද, අඩු පොලී අනුපාතික ව්‍යුහය පවත්වා ගෙන යෑමට සහාය විය. වසංගතය හේතුවෙන් ආර්ථිකයේ සමස්ත ඉල්ලුම මත ඇති වූ බලපෑම පිළිබිඹු කරමින් උද්ධමනය අඩු මට්ටමක පැවතීමත් සමඟ නුදුරු කාලීනව ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත් කිරීම කෙරෙහි 2020 වසරේ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී වැඩි අවධානයක් යොමු කළේය. සමස්ත ඉල්ලුම් තත්ත්වයන්ට නිසි සැලකිලිමත්බාවයක් යොමු කරමින් මැදි කාලීනව සියයට 4-6 ඉලක්කගත පරාසයක් තුළ උද්ධමනය පවත්වා ගෙන යෑමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවක් යටතේ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළේය.

**2020 වසර තුළ දී ගනු ලැබූ මුදල් ලිහිල්කරණ ක්‍රියාමාර්ග ආර්ථිකයට සම්ප්‍රේෂණය වීම වැඩි දියුණු කරමින්, ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු බෙදා හැරීම සහ ආර්ථික පුනර්ජීවනය සඳහා සහාය වීමට මහ බැංකුවේ සූදානම පිළිබඳව පාර්ශ්වකරුවන්ට සහතික වීම සඳහා වසංගත කාලය තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුව විවිධ මාධ්‍ය හරහා සිය සන්නිවේදනය ශක්තිමත් කළේය.** සමාජ දුරස්ථබාවය පිළිබඳ වැඩපිළිවෙල දැඩිව අනුගමනය කිරීමත් සමඟ, 2020 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුව මංගත සන්නිවේදන ක්‍රම කරා යොමු විය. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව මුදල් ප්‍රතිපත්ති පිළිබඳ මාධ්‍ය සාකච්ඡා මංගතව පැවැත් වූ අතර, ඒවා සමාජ මාධ්‍ය ජාලා තුළින් ද සජීවීව විකාශය කෙරිණ. තවද, ශ්‍රී ලංකා මහ බැංකුව මුදල් ප්‍රතිපත්ති හා සම්බන්ධ තොරතුරු අනෙකුත් පාර්ශ්ව අතර සන්නිවේදනය කිරීම සඳහා සමාජ මාධ්‍ය ජාල භාවිතා කළේය. මේ අතර, ඉදිරි කාල සීමාව සඳහා පුළුල් පදනමක් සහිත සාර්ව ආර්ථික ප්‍රතිපත්ති උපාය මාර්ග පිළිබඳ වෙළඳපොළ දැනුම්වත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමා විසින් "*පෙර දැක්ම: 2021 සහ ඉදිරිය සඳහා මුදල් සහ මූල්‍ය අංශ ප්‍රතිපත්ති*", 2021 වසර ආරම්භයේ දී මංගතව නිවේදනය කරන ලදී. ආර්ථිකයේ දක්නට ලැබුණු ප්‍රවණතාවලට අමතරව, ආර්ථිකය පිළිබඳ වඩා ඉදිරි දැක්මක් සහිතව 2021 වසරේ සිට ප්‍රකාශයට පත් කිරීමට නියමිත මුදල් ප්‍රතිපත්ති වාර්තාව පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව නිවේදනය කරන ලදී. මුදල් ප්‍රතිපත්ති වාර්තාව ප්‍රකාශයට පත් කිරීම කරා යොමු වීමේ දී, පාර්ශ්වකරුවන්ගේ උද්ධමන අපේක්ෂාවන්ට මග පෙන්වීමට සහාය දීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව 2020 වසරේ දී උද්ධමනය පිළිබඳ මැදි කාලීන පුරෝකථන, මුදල් ප්‍රතිපත්ති සමාලෝචන පුවත්පත් නිවේදනවලට ඇතුළත් කිරීම ආරම්භ කළේය. මේ අතර, කොවිඩ්-19 හේතුවෙන් ඇති වූ අභියෝග මධ්‍යයේ වුව ද, වාර්ෂික වාර්තාව සහ මෑතකාලීන ආර්ථික ප්‍රවණතා ඇතුළු ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රකාශන ඔස්සේ සාර්ව ආර්ථික ප්‍රවණතා පිළිබඳ තොරතුරු, භාෂා ත්‍රිත්වයෙන්ම කිසිදු ප්‍රමාදයකින් තොරව නිතිපතා ප්‍රකාශයට පත් කරන ලදී. මීට අමතරව, ප්‍රධාන සාර්ව ආර්ථික සංඛ්‍යා ලේඛන දිනපතා, සතිපතා, මාසිකව සහ කාර්තුමය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කෙරිණි.


**අඩු ඉල්ලුම් පීඩන මෙන්ම, මනාව පාලනය වූ උද්ධමන අපේක්ෂා සහ පරිපාලිත මිල සංශෝධන මගින් 2020 වසර තුළදී උද්ධමනය සාපේක්ෂව අඩු මට්ටමක පවත්වා ගැනීමට උපකාරී විය.** කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (කො.පා.මි.ද., 2013=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය ඉලක්කකගත සියයට 4-6 පරාසය තුළ පුළුල් වශයෙන් රැඳී පැවතුණි. ඒ හා සමානව, 2020 වසර ආරම්භයේ දී ඉහළ යෑමක් පෙන්නුම් කළ ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013=100) පදනම් කරගත් මතුපිට උද්ධමනය, වසර අවසානය වන විට ක්‍රමයෙන් අඩු විය. කො.පා.මි.ද. හි වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2020 පෙබරවාරි මාසයේ දී සියයට 6.2ක උපරිමයකට ළඟා වූ අතර, ඒ සඳහා අහිතකර කාලගුණික තත්ත්වයන් හේතුවෙන් ඇති වූ ඉහළ ආහාර උද්ධමනය ප්‍රධාන වශයෙන් හේතු විය. මෙම තත්ත්වය, ආහාර සහ ආහාර නොවන උද්ධමනයෙහි අඩු වීමත් සමඟ ක්‍රමයෙන් අඩු වූ අතර, වසර අවසානයේ දී සියයට 4.2ක් ලෙස වාර්තා විය. සැපයුම් අංශයේ බාධා මගින් 2020 වසරේ වැඩි කාලයක් තුළ ආහාර උද්ධමනය ඉහළ යෑම සඳහා බලපෑම් ඇති විය. වාර්ෂික සාමාන්‍ය පදනම මත, කො.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය, 2019 වසර අවසානයේ වාර්තා වූ සියයට 4.3 හා සැසඳීමේ දී 2020 වසර අවසානය වන විට සියයට 4.6ක් දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය. කො.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය හා සමාන රටාවක් අනුගමනය කළ ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය, 2020 පෙබරවාරි මාසයේ දී සියයට 8.1ක උපරිමයට ළඟා වූ අතර, ඉන් පසුව ක්‍රමයෙන් අඩු වී

**7.3 රූප සටහන**
**වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය සඳහා දායකත්වය (කොළඹ පාරිභෝගික මිල දර්ශකය)**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**7.4 රූප සටහන**
**වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය සඳහා දායකත්වය (ජාතික පාරිභෝගික මිල දර්ශකය)**





මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

2020 දෙසැම්බර් මස අවසානය වන විට සියයට 4.6ක් විය. ජා.පා.මි.ද. පැසෙහි ආහාර කාණ්ඩය මත වැඩි බර තැබීම හේතුවෙන්, කො.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය හා සැසඳීමේ දී, ජා.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය ඉහළ අගයක පැවතිණි. වාර්ෂික සාමාන්‍ය ජා.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය, 2019 වසර අවසානයේ පැවති සියයට 3.5 හා සැසඳීමේ දී, 2020 දෙසැම්බර් මාසයේ දී සියයට 6.2ක් දක්වා ඉහළ ගිය අතර, ඒ සඳහා අඛණ්ඩව පැවති ඉහළ ආහාර උද්ධමනය ප්‍රධාන වශයෙන් හේතු විය.

**උද්ධමනයේ යටිදැරි ප්‍රවණතාවන් පිළිබිඹු කරන සහ එබැවින් මුදල් ප්‍රතිපත්ති අරමුණු උදෙසා වඩාත් ප්‍රයෝජනවත් වන මූලික උද්ධමනය, අඩු ඉල්ලුම් තත්ත්ව පිළිබිඹු කරමින් 2020 වසර මුළුල්ලේ අඩු මට්ටම්වල පැවතිණි.** එකතු කළ අගය මත බද්ද අඩු කිරීම සහ ජාතිය ගොඩනැගීමේ බද්ද ඉවත් කිරීම හේතුවෙන් මිල ගණන් පහළ යෑම මෙන්ම, 2019 දෙසැම්බර් මස සිට ක්‍රියාත්මක වන පරිදි විදුලි සංදේශ බද්ද අඩු කිරීමත් සමඟ විදුලි සංදේශ සහ දත්ත සේවාවල මිල ගණන් අඩු වීම මගින් 2020 වසර ආරම්භයේ දී මූලික උද්ධමන දර්ශකයේ ඉහළ යෑම පාලනය විය. මෙම සාධක මෙන්ම හිතකර සංඛ්‍යානමය පදනම් බලපෑම 2020 වසරේ දී මූලික උද්ධමනය මන්දගාමී වීම සඳහා දායක විය. ඒ අනුව, කො.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය, 2019 වසර අවසානයේ දී වාර්තා කරන ලද සියයට 4.8 හා සැසඳීමේ දී 2020 වසර අවසානය වන විට සියයට 3.5ක් විය. වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය ද, 2019 වසර අවසානයේ දී වාර්තා වූ සියයට 5.5 හා සැසඳීමේ දී 2020 දෙසැම්බර් මාසයේ දී සියයට 3.1ක අඩු මට්ටමක පැවතිණි. ඒ හා සමාන ප්‍රවණතාවක් අනුගමනය කරමින්, ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය, 2019 වසර අවසානයේ පැවති සියයට 5.2 සිට 2020 වසර අවසානය වන විට සියයට 4.7ක් දක්වා මන්දගාමී විය. කෙසේ වෙතත්, සංඛ්‍යානමය පදනම් බලපෑම



**7.5 රූප සටහන**
**වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනයේ හැසිරීම**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

2020 වසර මැද දී ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනයෙහි ඉහළ යෑම සඳහා දායක විය. ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය ද 2019 වසර අවසානයේ දී වාර්තා වූ සියයට 5.7 සිට 2020 දෙසැම්බර් මස අවසානය වන විට සියයට 4.1ක් දක්වා මන්දගාමී විය.


**ශ්‍රී ලංකා මහ බැංකුවේ උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයෙන් පිළිබිඹු වන පරිදි, 2020 වසරෙහි ආයතනික අංශයේ උද්ධමන අපේක්ෂා, විශේෂයෙන්ම වසරේ දෙවන භාගය තුළ දී මනාව පාලනය වී පැවති අතර, ගෘහස්ත අංශයේ උද්ධමන අපේක්ෂා ඉහළ මට්ටමක පැවතිණි.** ආයතිනක අංශයේ උද්ධමන අපේක්ෂා 2020 වසරේ මුල් කාලය තුළ දී ඉහළ මට්ටමක පැවති අතර, ඉන් පසුව මන්දගාමී වී, වසරේ ඉතිරි කාලය තුළ දී මැද තනි අගයක මට්ටමේ පැවතිණි. ආයතනික අංශයේ උද්ධමන අපේක්ෂා සඳහා හේතු වූ ප්‍රධාන සාධක අතර, කොවිඩ්-19 ව්‍යාප්තිය හමුවේ අඩු වූ සමස්ත ඉල්ලුම සහ දේශීය සැපයුම් අංශයේ අපේක්ෂිත හිතකර වර්ධනයන් යන කරුණු පැවතිණි. කොවිඩ්-19 හි බලපෑමත් සමඟ දේශීය නිෂ්පාදනයේ අපේක්ෂිත පහළ වැටීම, ආනයන සීමා කිරීම්, ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම සහ මැතිවරණ කාල අතරතුර රාජ්‍ය වියදම ඉහළ යෑම වැනි සාධක දක්වමින්, ඉදිරි කාලයේ දී උද්ධමනය වසර මුළුල්ලේම ඉහළ මට්ටම්වල රැඳී පවතිනු ඇතැයි ගෘහස්ත අංශයේ ප්‍රතිචාර දැක්වූවන් අපේක්ෂා කරන ලදී. කෙසේ වෙතත්, කොවිඩ්-19 හි බලපෑම පහව යෑමත් සමඟ සමස්ත ඉල්ලුමෙහි අපේක්ෂිත යථා තත්ත්වයට පත්වීම මගින් වෙළඳපොළ ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන් ඉදිරි කාලය තුළ දී උද්ධමනය ඉහළ යනු ඇතැයි ආයතනික සහ ගෘහස්ථ යන දෙඅංශයේම ප්‍රතිචාර දැක්වූවන් විසින් අපේක්ෂා කරන ලදී.

## 7.3 පොලී අනුපාතිකවල හැසිරීම

### වෙළඳපොළ ද්‍රවශීලතාව සහ කෙටි කාලීන පොලී අනුපාතික

**ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය, ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රාථමික වෙළඳපොළෙන් භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලැබූ අනෙකුත් මෙහෙයුම් ක්‍රියාමාර්ගවල බලපෑම පිළිබිඹු කරමින්, 2020 වසරේ දී දේශීය මුදල් වෙළඳපොළ රුපියල් ද්‍රවශීලතාව අතිරික්ත මට්ටමක පැවතුණි.** කොවිඩ්-19 ව්‍යාප්තියත් සමඟ එමගින් බලපෑමට ලක් වූ ව්‍යාපාර සහ පුද්ගලයන්ට සහාය දැක්වීමට සහ

**7.6 රූප සටහන**
**දේශීය මුදල් වෙළඳපොළ රුපියල් ද්‍රවශීලතාව සහ ද්‍රවශීලතා කළමනාකරණය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත් කිරීමට මූල්‍ය වෙළඳපොළට ප්‍රමාණවත් අවකාශයක් ලබා දීම සඳහා 2019 අප්‍රේල් මස මැද සිට පුළුල් වශයෙන් අතිරික්ත මට්ටමක පැවති දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව, සැලකිය යුතු ලෙස ඉහළ මට්ටමක පවත්වා ගෙන ගියේය. 2020 මාර්තු සහ ජූනි මාසවල දී ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය[1] අඩු කිරීම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රාථමික වෙළඳපොළෙන් රජයේ සුරැකුම්පත් මිලදී ගනු ලැබීම, ශ්‍රී ලංකා මහ බැංකුවේ බෙදා හැරිය හැකි ලාභය රජයට ලබා දීම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් විදේශ විනිමය මිලදී ගනු ලැබීම, බලපත්‍රලාභී බැංකු සමඟ විදේශ විනිමය හුවමාරු ගිවිසුම්වලට එළඹීම සහ සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන යෝජනා ක්‍රම යටතේ ණය ලබා දීම්හි ප්‍රතිඵලයක් ලෙස, මෙම කාලපරිච්ඡේදය තුළ දී දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. තවද, ද්‍රවශීලතා ආධාරක පහසුකම හරහා අවශ්‍ය පරිදි බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන්ට අතිරේක ද්‍රවශීලතාව සැපයිණි. ඉන් පසුව, එක් දින මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව 2020 ජූනි මාසයේ මැද වන විට රුපියල් බිලියන 220ක් පමණ දක්වා ඉහළ ගිය අතර, ශ්‍රී ලංකා මහ බැංකුව මෙම අතිරික්ත

1 ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සියයට 2 දක්වා අඩු කිරීමත් සමඟ ශ්‍රී ලංකා මහ බැංකුව ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සඳහා වූ කැට මුදල් ගැළපුම ද සියයට 2 සිට සියයට 1 දක්වා අඩු කරන ලදී.

7

ද්‍රවශීලතා තත්ත්වය වෙළඳපොළෙහි රැඳී පැවතීමට ඉඩ සලසා දෙමින්, ඒ හරහා වෙළඳපොළ පොලී අනුපාතික පහත දැමීමටත්, ණය ලබා දීම් දිරි ගැන්වීමටත් කටයුතු කළේය. නියමිත විදේශ ණය ආපසු ගෙවීම් හරහා ඇති වන ද්‍රවශීලතා අඩු වීම මධ්‍යයේ, ශ්‍රී ලංකා මහ බැංකුව 2020 සැප්තැම්බර් මස අග සිට නොවැම්බර් මස මැද දක්වා කාලය තුළ කාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි පැවැත් වීම සහ ද්‍රවශීලතා ආධාරක පහසුකම හරහා ද්‍රවශීලතාව සැපයීය. මෙම ප්‍රවණතා සමඟ, 2019 වසරේ දී රුපියල් බිලියන 30ක පමණ සාමාන්‍යයක පැවති එක් දින දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව, 2020 වසරේ දී රුපියල් බිලියන 130ක පමණ අගයක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. තවද, නියමිත විදේශ ණය ආපසු ගෙවීම් සහ රජයේ සුරැකුම්පත්වල කල්පිරීම් හේතුවෙන් විටින් විට ද්‍රවශීලතාව අඩු වුව ද, ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රාථමික වෙළඳපොළෙන් රජයේ සුරැකුම්පත් මිලදී ගැනීම හේතුවෙන් මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව, සාමාන්‍යයක් ලෙස, 2021 වසරේ පළමු කාර්තුවේ දී රුපියල් බිලියන 160ක් පමණ අගයකට ඉහළ ගියේය. දේශීය මුදල් වෙළඳපොළ තුළ පැවති අතිරික්ත ද්‍රවශීලතාව ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකමෙහි තැන්පත් කෙරුණු අතර, ඇතැම් මූල්‍ය ආයතන විසින් නිත්‍ය ණය පහසුකම වෙත යොමු වීම ද මෙම කාලපරිච්ඡේදයේ දී නිරීක්ෂණය වුණි.

**2020 වසර ආරම්භයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවේ මධ්‍යය ආසන්නයේ පැවති බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, දේශීය මුදල් වෙළඳපොළෙහි පැවති අතිරික්ත ද්‍රවශීලතා තත්ත්වයන්ට ප්‍රතිචාර වශයෙන් පහළ ගොස්, 2020 ජූනි මස අවසානයේ සිට ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවේ පහළ සීමාව ආසන්නයෙන් පැවතුණි.** 2020 ජනවාරි මස අවසානයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 50කින් අඩු කිරීම සහ ඉන්පසු 2020 මාර්තු මස සිට මැයි මස දක්වා කාලය තුළ ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 100කින් අඩු කිරීමත් සමග බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය ද අඩු වූ අතර, එය 2020 ජූනි මස මැද වන තුරු ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවේ මධ්‍යය ආසන්නයේ අඛණ්ඩව පැවතිණි. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 2020 ජූනි මස මැද දී ප්‍රතිශතාංක 2කින් අඩු කිරීමත් සමඟ අතිරේක ද්‍රවශීලතාව සැලකිය යුතු ප්‍රමාණයක් වෙළඳපොළට නිකුත් කෙරුණු අතර, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවේ පහළ සීමාව තෙක් පහත වැටුණි. අතිරික්ත ද්‍රවශීලතා තත්ත්ව මධ්‍යයේ අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළඳපොළෙහි සීමිත ගනුදෙනු සංඛ්‍යාවක් සිදු වීම මගින් ද, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයෙහි මෙම අඩු වීම සඳහා සහාය විය. 2020 ජූලි මාසයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික අඩු කිරීමෙන් අනතුරුව, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය ද පදනම් අංක 100කින් පමණ පහත වැටුණු අතර, 2020 වසරේ ඉතිරි කාලපරිච්ඡේදය මුළුල්ලේ ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවේ පහළ සීමාව ආසන්නයේ පැවතිණි. විශේෂයෙන්ම, බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් අතර අසමමිතික ද්‍රවශීලතා ව්‍යාප්තිය හේතුවෙන් හට ගත් ඇතැම් විචලනයන් හමුවේ වුව ද, ප්‍රතිමිලදී ගැනුම් වෙළඳපොළ ගනුදෙනුවල බරිත සාමාන්‍ය එලදා

**7.2 සංඛ්‍යා සටහන**

**තෝරාගත් මුදල් වෙළඳපොළ පොලී අනුපාතික**

වාර්ෂික පොලී අනුපාතිකය සියයට

| | බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය | | එක් දින විවට වෙළඳපොළ වෙන්දේසි | | ශ්‍රී ලංකා අන්තර් බැංකු අර්පණ අනුපාතිකය (එක් දින) (අ) | | ශ්‍රී ලංකා අන්තර් බැංකු අර්පණ අනුපාතිකය (මාස 12) (අ) | |
|---|---|---|---|---|---|---|---|---|
| | කාලපරිච්ඡේදය අග | මාසික සාමාන්‍යය | ප්‍රතිමිලදී ගැනුම් | ප්‍රතිවිකුණුම් | කාලපරිච්ඡේදය අග | මාසික සාමාන්‍යය | කාලපරිච්ඡේදය අග | මාසික සාමාන්‍යය |
| දෙසැ.-17 | 8.15 | 8.13 | 7.25 | - | 8.15 | 8.15 | 12.18 | 12.19 |
| දෙසැ.-18 | 8.95 | 8.96 | - | 8.98 | 9.00 | 9.00 | 11.80 | 11.77 |
| දෙසැ.-19 | 7.45 | 7.51 | - | 7.50 | 7.51 | 7.54 | 10.33 | 10.42 |
| මාර්.-20 | 6.75 | 6.87 | 6.76 | 6.76 | 6.75 | 6.87 | 9.13 | 9.40 |
| ජූනි -20 | 5.52 | 5.71 | - | 5.88 | 5.53 | 5.74 | 8.50 | 8.51 |
| සැප්. -20 | 4.53 | 4.52 | - | - | - | - | - | - |
| දෙසැ.-20 | 4.55 | 4.54 | - | - | - | - | - | - |

(අ) 2020 ජූලි 01 දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා අන්තර් බැංකු අර්පණ අනුපාතිකය ගණනය කිරීම සහ ප්‍රකාශනය අත්හිටුවන ලදී.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

අනුපාතික, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයේ විචලනයන් හා සමාන හැසිරීමක් පෙන්නුම් කළේය. 2020 වසර අවසානය වන විට ප්‍රතිමිලදී ගැනුම් වෙළඳපොළෙහි ගනුදෙනුවල බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය සියයට 4.57ක් ලෙස වාර්තා වුණි.

### රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික

**මුදල් ලිහිල්කරණය, කොවිඩ්-19 වසංගතය හමුවේ රජයේ සුරැකුම්පත් සඳහා වූ ආයෝජක කැමැත්ත, ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රාථමික වෙන්දේසිවල දී රජයේ සුරැකුම්පත් මිලදී ගැනීම සහ ප්‍රාථමික වෙළඳපොළ රජයේ සුරැකුම්පත් වෙන්දේසිවල ලංසු සඳහා උපරිම ඵලදා අනුපාතික පැනවීම යනාදියෙහි බලපෑම පිළිබිඹු කරමින්, 2020 වසරේ දී රජයේ සුරැකුම් මත ඵලදා අනුපාතික සැලකිය යුතු අඩු වීමක් වාර්තා කළේය.** ඒ අනුව, විදේශීය මූල්‍යයනය සඳහා ඇති සීමිත ප්‍රවේශය මධ්‍යයේ රජයේ දේශීය මූල්‍යයනය සැලකිය යුතු ලෙස වැඩි වුව ද, 2020 වසරේ දී සියලුම කල්පිරීම්වල[2] ප්‍රාථමික සහ ද්විතීයික වෙළඳපොළ රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික පදනම් අංක 226-414ත් අතර ප්‍රමාණයකින් අඩු විය. වසංගතය මධ්‍යයේ ඉහළ ගිය අවිනිශ්චිතතා සහ ඍණාත්මක වෙළඳපොළ අපේක්ෂා හේතුවෙන් බැංකු අංශය අවදානම් රහිත වත්කම් වෙත යම් පමණකට යොමු විය. ඵලදා අනුපාතික පිළිබඳව වෙළඳපොළ වෙත දැනුම් දීම සඳහා රජය විසින් භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රාථමික වෙන්දේසිවල දී ලංසු පිළිගැනීම උදෙසා උපරිම ඵලදා අනුපාතික පනවන ලදී. වසංගත තත්ත්වයත් සමඟ ඇති වූ සුවිශේෂී වාතාවරණය හමුවේ, ප්‍රාථමික වෙළඳපොළ භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිවල දී සහභාගීවන්නන් විසින් මිලදී නොගත් භාණ්ඩාගාර බිල්පත් කොටස ශ්‍රී ලංකා මහ බැංකුව මිලදී ගත් අතර, එමගින් රජයේ අරමුදල් අවශ්‍යතා සපුරාලීම මෙන්ම, රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික පහළ මට්ටමක පවත්වා ගැනීමට ද සහාය විය. කෙසේ වෙතත්, රජයේ ඉහළ ගිය මූල්‍යයන අවශ්‍යතා පිළිබඳ වෙළඳපොළ අපේක්ෂා පිළිබිඹු කරමින්, විශේෂයෙන්ම ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් පහළ දැමීමෙන් පසුව සහ වසර අවසානය වන විට පැවැත් වූ භාණ්ඩාගාර සුරැකුම්පත් වෙන්දේසිවල දී ඵලදා අනුපාතික යම් ඉහළ යෑමක් පෙන්නුම් කළේය. 2020 වසර අවසානය වන විට, දින 91, දින 182 හා දින 364ක කල්පිරීම් සහිත භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ ප්‍රාථමික වෙළඳපොළ ඵලදා අනුපාතික 2019 වසර අවසානය හා සැසඳීමේ දී, පිළිවෙලින්, පදනම් අංක 282කින්, 322කින් සහ 340කින් පහළ ගියේය. ප්‍රාථමික වෙළඳපොළෙහි සියලුම කල්පිරීම්වල[2] භාණ්ඩාගාර බැඳුම්කර මත ඵලදා අනුපාතික 2020 වසරේ දී පදනම් අංක 284-414ත් අතර ප්‍රමාණයකින් අඩු විය. වසර 10 හෝ ඊට වඩා වැඩි කල්පිරීම්වල භාණ්ඩාගාර බැඳුම්කර දෙකක් පමණක් නිකුත් කිරීම මගින් පිළිබිඹු වන පරිදි, රජය වසර මුළුල්ලේ කෙටි කාලීන සහ මැදි කාලීන මූල්‍යයන


**7.7 රූප සටහන**
**භාණ්ඩාගාර බිල්පත් සඳහා ප්‍රාථමික වෙළඳපොළ ඵලදා අනුපාතික (අ)**




(අ) ලංසු පිළිගත නොහැකිවීම හෝ අදාළ පරිණත කාලය සඳහා සුරැකුම්පත් නිකුතු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඇතැම් සති සඳහා ඵලදා අනුපාතික වාර්තා නොවේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**7.8 රූප සටහන**
**රජයේ සුරැකුම්පත් සඳහා ද්විතීයික වෙළඳපොළ ඵලදා වක්‍රය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

2 2020 ජනවාරි මාසයේ සිට වසර 10 භාණ්ඩාගාර බැඳුම්කර නව නිකුත් කිරීම් කිසිවක් නොතිබූ හෙයින්, වසර 10 භාණ්ඩාගාර බැඳුම්කර ඵලදා අනුපාතික ඇතුළත් නොවේ.

7

මත බොහෝ විට රඳා පැවතුණි. සාමාන්‍යයෙන්, ප්‍රාථමික වෙළඳපොළෙහි දිගු කාලීන කල්පිරීම් සහිත භාණ්ඩාගාර බැඳුම්කරවලට සාපේක්ෂව කෙටි කාලීන කල්පිරීම් සහිත භාණ්ඩාගාර බැඳුම්කර ඵලදා අනුපාතික විශාල වශයෙන් අඩු වීමක් වාර්තා කළේය. රජයේ සුරැකුම්පත් මත ද්විතීයික වෙළඳපොළ ඵලදා අනුපාතික ද ප්‍රාථමික වෙළඳපොළ ඵලදා අනුපාතිකවල ප්‍රවණතාව අනුගමනය කළේය. සියලුම කල්පිරීම්වල ද්විතීයික වෙළඳපොළ භාණ්ඩාගාර බිල්පත් මත ඵලදා අනුපාතික පදනම් අංක 288-338කින් අඩු වූ අතර, භාණ්ඩාගාර බැඳුම්කර මත ඵලදා අනුපාතික පදනම් අංක 226-311ක පරාසයකින් අඩු විය. මේ අතර, රජය 2020 වසරේ දී විවිධ ස්ථාවර සහ විචල්‍ය අනුපාතික යටතේ, එක්සත් ජනපද ඩොලරයෙන් නාමනය කරන ලද ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ඔස්සේ අරමුදල් සපුරා ගැනීම සිදු කෙරිණි. මෙම වෙන්දේසි හරහා සියයට 5.70-6.87ක පරාසයක ස්ථාවර පොලී අනුපාතික යටතේ සහ මාස හය ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතික මත පදනම් අංක 389-609ක පරාසයක අන්තිකයක් සහිත විචල්‍ය අනුපාතික ගිවිසුම් යටතේ එක්සත් ජනපද ඩොලර් මිලියන 507ක් රැස් කර ගන්නා ලදී. ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ නියෝජිත ආයතන විසින් ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් පහළ දැමීමෙන් අනතුරුව ඇති වූ සෘණාත්මක ආයෝජක අපේක්ෂා හේතුවෙන්, ශ්‍රී ලංකාවේ ද්විතීයික වෙළඳපොළ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර මත ඵලදා අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, වසර මුළුල්ලේ අඛණ්ඩව විචලනයන් පෙන්නුම් කළේය.

### තැන්පතු සහ ණය පොලී අනුපාතික

**ලිහිල් මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලට ප්‍රතිචාර වශයෙන් වෙළඳපොළ තැන්පතු පොලී අනුපාතික සැලකිය යුතු ලෙස පහළ ගියේය.** ඒ අනුව, බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (AWNDR)[3] සහ බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWNFDR)[4] 2014 වසරේ එම අනුපාතික සම්පාදනය කිරීම ආරම්භ කළ දා සිට ඒවායේ අවම මට්ටම් වූ, සියයට 4.93ක් ලෙස 2020 දෙසැම්බර් මාසයේ දී සහ සියයට 5.07ක් ලෙස 2020 නොවැම්බර් මාසයේ දී වාර්තා කළේය. බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය

7

3 බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (AWNDR), මාසයක් තුළ බලපත්‍රලාභී වාණිජ බැංකුවල තැන්පත් කර ඇති සියලුම පොලී උපයන නව රුපියල් තැන්පතුවලට අදාළ පොලී අනුපාතික මත පදනම්ව වේ.

4 බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWNFDR), මාසයක් තුළ බලපත්‍රලාභී වාණිජ බැංකුවල තැන්පත් කර ඇති සියලුම පොලී උපයන නව කාලීන රුපියල් තැන්පතුවලට අදාළ පොලී අනුපාතික මත පදනම්ව වේ.

## 7.3 සංඛ්‍යා සටහන
## පොලී අනුපාතිකවල හැසිරීම


වාර්ෂික පොලී අනුපාතිකය සියයට

| පොලී අනුපාතිකය | 2019 අවසානයට | 2020 අවසානයට | පදනම් අංකවල වෙනස |
|---|---|---|---|
| **ප්‍රතිපත්ති පොලී අනුපාතික** | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය | 7.00 | 4.50 | -250 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය | 8.00 | 5.50 | -250 |
| **බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය** | 7.45 | 4.55 | -290 |
| **රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික** | | | |
| ප්‍රාථමික වෙළඳපොළ (අ) | | | |
| **භාණ්ඩාගාර බිල්පත්** | | | |
| දින 91 | 7.51 | 4.69 | -282 |
| දින 182 | 8.02 | 4.80 | -322 |
| දින 364 | 8.45 | 5.05 | -340 |
| **භාණ්ඩාගාර බැඳුම්කර** | | | |
| වසර 2 | 9.79 (ආ) | 5.65 (ඇ) | -414 |
| වසර 3 | 9.65 (ආ) | 5.99 (ඇ) | -366 |
| වසර 4 | - | 6.32 (ඇ) | - |
| වසර 5 | 9.87 (ආ) | 6.79 (ඇ) | -308 |
| වසර 10 | 10.23 (ආ) | 9.99 (ඇ) | -24 |
| ද්විතීයික වෙළඳපොළ | | | |
| **භාණ්ඩාගාර බිල්පත්** | | | |
| දින 91 | 7.52 | 4.63 | -289 |
| දින 182 | 7.88 | 4.73 | -315 |
| දින 364 | 8.36 | 4.98 | -338 |
| **භාණ්ඩාගාර බැඳුම්කර** | | | |
| වසර 2 | 8.60 | 5.56 | -304 |
| වසර 3 | 9.08 | 5.96 | -312 |
| වසර 4 | 9.46 | 6.40 | -306 |
| වසර 5 | 9.67 | 6.65 | -302 |
| වසර 10 | 10.05 | 7.55 | -250 |
| **බලපත්‍රලාභී වාණිජ බැංකු (ඈ)** | | | |
| ***තැන්පතු පොලී අනුපාතික*** | | | |
| ඉතිරිකිරීමේ තැන්පතු | 0.20-7.50 | 0.10-7.00 | - |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු (ඉ) | 3.55-15.00 | 0.25-15.00 | - |
| බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (ඊ) | 8.20 | 5.80 | -240 |
| බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (ඊ) | 10.05 | 7.14 | -291 |
| බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (ඊ) | 8.89 | 4.93 | -396 |
| බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය (ඊ) | 9.17 | 5.08 | -409 |
| ***ණය පොලී අනුපාතික*** | | | |
| බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය (මාසික) | 10.00 | 5.74 | -426 |
| බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය | 13.59 | 10.29 | -330 |
| බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය | 12.80 | 8.38 | -442 |
| **අනෙකුත් මූල්‍ය ආයතන (උ)** | | | |
| ***තැන්පතු පොලී අනුපාතික*** | | | |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | | | |
| ඉතිරිකිරීමේ තැන්පතු | 4.00 | 3.50 | -50 |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 9.83 | 5.25 | -458 |
| බලපත්‍රලාභී මුදල් සමාගම් (ඌ) | | | |
| ඉතිරිකිරීමේ තැන්පතු | 5.14-7.10 | 3.40-4.74 | - |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 10.98-11.97 (එ) | 6.56-7.21 | |
| ***ණය පොලී අනුපාතික*** | | | |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 12.00-14.50 | 7.00-10.00 | - |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව (ඒ) | 10.25-18.00 | 8.73-12.50 | - |
| බලපත්‍රලාභී මුදල් සමාගම් (ඌ) | | | |
| මූල්‍ය කල්බදු | 14.75-27.40 (එ) | 14.31-28.97 | - |
| කුලීපිට ගැනුම් | 13.40-24.82 | 13.71-20.05 | - |
| නිශ්චල දේපළ මත ලබා දුන් ණය | 15.53-16.71 | 19.95-22.30 | - |
| **සාංගමික ණය වෙළඳපොළ** | | | |
| ණයකර | 12.30-15.50 | 9.00-13.25 | - |
| වාණිජ පත්‍රිකා | 13.00-16.25 | 6.50-15.50 | - |

(අ) ආසන්නතම වෙන්දේසියේ දී නිකුත් කළ බරිත සාමාන්‍ය ඵලදා අනුපාතික
(ආ) 2019 වසරේ දී අවසාන ප්‍රාථමික වෙන්දේසිය
වසර 2 - ජූනි 13; වසර 3 - ඔක්. 11;
වසර 5 - දෙසැ. 12; වසර 10 - දෙසැ. 12
(ඇ) 2020 වසරේ දී අවසාන ප්‍රාථමික වෙන්දේසිය
වසර 2 - සැප්. 28; වසර 3 - දෙසැ. 11;
වසර 4 - නොවැ. 12; වසර 5 - දෙසැ. 11; වසර 10 - ජන. 13
(ඈ) බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සපයන ලද පොලී අනුපාතික මත පදනම් වේ.
(ඉ) ඇතැම් වාණිජ බැංකු විසින් සැපයූ විශේෂ පොලී අනුපාතික මෙහි උපරිම පොලී අනුපාතිකය වේ.
(ඊ) රජයේ අනුමැතිය මත ලබා දෙන සියයට 15 ක් වූ ජ්‍යෙෂ්ඨ පුරවැසි විශේෂ ස්ථාවර තැන්පතු අනුපාතිකයෙහි බලපෑම ඉවත් කිරීම සඳහා 2018 වසරේ ජූලි මස සිට බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය සහ බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය ගණනය කරනු ලබන්නේ අදාළ වෙළඳපොළ පොලී අනුපාතික මඟිනි. 2018 ජූනි මස සිට බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය සහ බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය ගණනය කිරීම සඳහා මෙම ක්‍රමය භාවිතා වේ.
(උ) තෝරාගත් අනෙකුත් මූල්‍ය ආයතන විසින් සපයන ලද පොලී අනුපාතික මත පදනම් වේ.
(ඌ) පොලී අනුපාතික පරාසයන් බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් අදාළ මාසයේ දී තැන්පතු නැවත ලබා ගැනීම සහ ණය ලබාදීම සඳහා ඉදිරිපත් කරනු ලබන උපරිම සහ අවම සාමාන්‍ය පොලී අනුපාතික මත පදනම් වේ. 2020 වසර සඳහා දත්ත තාවකාලික වේ.
(එ) සංශෝධිත
(ඒ) නිවාස කටයුතු සඳහා දෙන ලද ණය පමණි.


මූලයන්: අදාළ මූල්‍ය ආයතන
කොළඹ කොටස් හුවමාරුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**7.9 රූප සටහන**
**තෝරාගත් වෙළඳපොළ පොලී අනුපාතිකයන්ගේ හැසිරීම**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**7.10 රූප සටහන**
**සුරැකුම් වර්ගය අනුව බරිත සාමාන්‍ය ණය අනුපාතික (සියයට)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(AWDR)[5] 2005 අගෝස්තු මාසයෙන් පසු එහි අවම මට්ටම වාර්තා කරමින් 2020 වසර අවසානයේ දී, සියයට 5.80ක් වූ අතර, බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWFDR)[6] 2015 මැයි මාසයෙන් අනතුරුව එහි අවම මට්ටම වාර්තා කරමින්, 2020 වසර අවසානයේ දී සියයට 7.14ක් විය. තැන්පතු අනුපාතිකවල පහත වැටීමේ වේගය 2020 වසරේ අග භාගයේ දී මන්දගාමී විය. උද්ධමනය අඩු මට්ටමක පැවතීම හමුවේ, තැන්පතු අනුපාතික සැලකිය යුතු ලෙස අඩු වීමෙහි ප්‍රතිඵලයක් ලෙස ඉතුරුම් තැන්පතු සහ නව කෙටි කාලීන ස්ථාවර තැන්පතු වැනි ඇතැම් තැන්පතු සඳහා සෘණාත්මක මූර්ත ප්‍රතිලාභ ලැබීමට හේතු වූ අතර, එමගින් තැන්පතුවලින් ලැබෙන පොලී ආදායමෙන් යැපෙන ජන කොටසකට බලපෑම් ඇති විය. විශේෂයෙන් ශීඝ්‍රයෙන් වයස්ගත වන ජනගහණයක් සිටින වාතාවරණයක් තුළ, ඉතුරුම් මගින් ලැබෙන අඩු ප්‍රතිලාභවල සෘණාත්මක බලපෑම අවම කිරීම සඳහා අඩු පොලී අනුපාතික ව්‍යුහයක් තුළ විකල්ප ආයෝජන අවස්ථා ඇති කිරීමේ අවශ්‍යතාව පෙන්නුම් කෙරේ.

**ලිහිල් මුදල් ප්‍රතිපත්තියේ සහ මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණය වේගවත් කිරීම සඳහා ගනු ලැබූ අනෙකුත් ක්‍රියාමාර්ගවල බලපෑම පිළිබිඹු කරමින්, වෙළඳපොළ ණය අනුපාතික මෙතෙක් වාර්තා වූ අවම මට්ටම් කරා පහළ ගිය අතර, එමගින් දේශීය ආයෝජන ඉහළ නැංවීම සඳහා පහසුකම් සැලසිණි.** ඒ අනුව, 2020 වසරේ දී ණය අනුපාතික සැලකිය යුතු ලෙස අඩු වූ අතර, සතිපතා බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය (AWPR)[7] 2020 වසර අවසානය වන විට සියයට 5.81 දක්වා අඩු විය. මේ අතර, බරිත සාමාන්‍ය නව ණය අනුපාතිකය (AWNLR)[8] සහ බරිත සාමාන්‍ය ණය අනුපාතිකය (AWLR)[9] 2020 වසර අවසානයේ දී, පිළිවෙලින්, සියයට 8.38ක් සහ සියයට 10.29ක් දක්වා සැලකිය යුතු ලෙස අඩු විය. නව ණය අනුපාතික අඩු වීම පිළිබිඹු කරමින් තනි අගයක පොලී අනුපාතික යටතේ ලබා දුන් නව ණය ප්‍රමාණය, 2019 වසර අවසානයේ දී පැවති සියයට 23ක් පමණ අගයේ සිට 2020 වසර අවසානය වන විට සියයට 88 ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ අතර, 2019 වසර අවසානය හා සැසඳීමේ දී 2020 වසර අවසානය වන විට සුරැකුම්පත් මත පදනම් වූ ණය සඳහා වන බරිත සාමාන්‍ය ණය අනුපාතිකවල අඩු වීමක් දක්නට ලැබුණි. බලපත්‍රලාභී බැංකු විසින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට ලබා දෙනු ලබන ණය සඳහා වන සාමාන්‍ය පොලී අනුපාතික පිළිබඳ දත්ත රැස් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව 2020 ජූලි මාසයේ දී කුඩා සහ මධ්‍ය පරිමාණ

5 බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR) බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතැති සියලුම පොලී උපයන රුපියල් තැන්පතුවලට අදාළ පොලී අනුපාතික මත පදනම්ව වේ.

6 බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWFDR), බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතැති සියලුම පොලී උපයන කාලීන රුපියල් තැන්පතුවලට අදාළ පොලී අනුපාතික මත පදනම්ව වේ.

7 බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය (AWPR), සතියක් තුළ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිය ප්‍රධාන ගනුදෙනුකරුවන්ට ලබා දුන් කෙටි කාලීන රුපියල් ණය හා අත්තිකාරම් සඳහා වන පොලී අනුපාතික මත පදනම් වේ.

8 බරිත සාමාන්‍ය නව ණය අනුපාතිකය (AWNLR), මාසයක් තුළ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සපයන ලද නව රුපියල් ණය සහ අත්තිකාරම්වලට අදාළ පොලී අනුපාතික මත පදනම් වේ.

9 බරිත සාමාන්‍ය ණය අනුපාතිකය (AWLR) බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සපයන ලද සියලුම රුපියල් ණය සහ අත්තිකාරම් වලට අදාළ පොලී අනුපාතික මත පදනම් වේ.

7


## විශේෂ සටහන 6
## ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වෙත ලබා දෙන බැංකු ණය


**හැඳින්වීම**

ආර්ථික කාර්යසාධනයේ ප්‍රාදේශීය විෂමතා අඩු කිරීම මගින් සමාජයේ සෑම කොටසකටම ප්‍රතිලාභ ලැබෙන පරිදි වූ වර්ධනය (Inclusive growth) ප්‍රවර්ධනය කිරීමේ හැකියාව සහ පසු කාලීනව විශාල ව්‍යාපාර දක්වා වර්ධනය වීම තුළින් ව්‍යාපාර පවතින කාලය මුළුල්ලේ ජනගහණයෙන් සැලකිය යුතු කොටසකට රැකියා ලබා දෙමින් රටේ ආර්ථික වර්ධනයට දායක වීමට ඇති හැකියාව හේතුවෙන්, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආර්ථිකයේ සංවර්ධනය සඳහා විශාල කාර්යභාරයක් ඉටු කරන බව පොදු පිළිගැනීමයි. බොහෝ රටවල සියලු ව්‍යවසායන්ගෙන් සියයට 90ක් පමණ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලින් සමන්විත වන අතර, එමගින් ගෝලීය රැකියාවලින් සියයට 70ක් පමණ සැපයෙන බව ජාත්‍යන්තර කම්කරු සංවිධානය 2019 වසරේ දී වාර්තා කරන ලදී.[1] 2013/14 කාලයේ දී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව[2] විසින් කෘෂිකාර්මික නොවන ආර්ථික කටයුතු පිළිබඳ පවත්වන ලද ආර්ථික සංගණනයට අනුව, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික නොවන ව්‍යවසායයන් අතරින් සියයට 99ක් පමණ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වූ අතර, රටේ සේවානියුක්තියෙන් සියයට 45ක් පමණ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයේ පවතින බව කර්මාන්ත සහ වාණිජ අමාත්‍යාංශය[3] විසින් 2016 වසරේ දී තක්සේරු කර ඇත.

ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වර්ධනයට පවතින ප්‍රධාන බාධාවක් ලෙස මූල්‍යකරණයට තිබෙන සීමිත ප්‍රවේශය දක්වා ඇත. ආසියානු සංවර්ධන බැංකුවට අනුව,[4] අ) අවදානම් මග හැරීමේ බැංකුකරණය සහ ඇපසුරැකුම් මත අධික ලෙස යැපීම වැනි මූල්‍ය ආයතන තුළ පවතින අඩුලුහුඬුකම්, ආ) අසමමිතික තොරතුරු මග හරවා ගැනීමට ප්‍රමාණවත් යාන්ත්‍රණයන් නොතිබීම ඇතුළු වෙළඳපොළ යටිතල පහසුකම් තුළ පවතින දුර්වලතා සහ ඇ) දුර්වල මූල්‍ය සාක්ෂරතාව, වෙළඳපොළ පිළිබඳ අඩු දැනුම සහ අඩු විනිවිදභාවය වැනි ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර තුළ පවතින දුර්වලතා ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයේ ණය ලබා ගැනීම් සීමා කිරීමට දායක වන ප්‍රධාන සාධක ලෙස දක්වා ඇත. මේ සම්බන්ධව සලකා බැලීමේ දී, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය සඳහා ලබා දුන් ණය ප්‍රමාණය මෙන්ම, අය කරන ලද පොලී අනුපාතික පිළිබඳව ඇගයීම සඳහා අඛණ්ඩව තොරතුරු නොලැබීම ඵලදායී ප්‍රතිපත්ති සම්පාදනයට පැවැති ප්‍රධාන බාධාවක් විය. ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර කොවිඩ්-19 වසංගතයෙන් දැඩි ලෙස බලපෑමට ලක් වීමත් සමඟ වසංගත සමය තුළ දී මෙම තොරතුරුවල හිඟකම වඩාත් පැහැදිලිව දක්නට ලැබිණි. එවැනි තොරතුරුවල වැදගත්කම සැලකිල්ලට ගනිමින් මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු විසින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වෙත ලබා දුන් ණය පිළිබඳ මාසික

රූප සටහන වි.ස. 6.1
බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වෙත ලබා දුන් ණය මත වූ සාමාන්‍ය පොලී අනුපාතික








මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

1 International Labour Organization (2019) බලන්න
2 Department of Census and Statistics (2015) බලන්න
3 Ministry of Industry and Commerce (2016) බලන්න
4 Asian Development Bank (2017) බලන්න

**රූප සටහන වි.ස. 6.2**

**බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වෙත ලබා දුන් ණය මත වූ සාමාන්‍ය පොලී අනුපාතික**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


සමීක්ෂණයක්[5] 2020 ජූලි මාසයේ දී ආරම්භ කරන ලදී. බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වෙත ලබා දුන් ණයෙහි සාමාන්‍ය පිරිවැය හඳුනා ගැනීම, මෙම *'කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය සමීක්ෂණයේ'* ප්‍රධාන අරමුණ වේ. මේ සඳහා, බරිත සාමාන්‍ය පොලී අනුපාතික ගණනය කිරීමට අනුරූපී ණය ප්‍රමාණය පිළිබඳ තොරතුරු ද රැස් කරනු ලැබේ.

**කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය සමීක්ෂණයේ සොයා ගැනීම්**

සමීක්ෂණ දත්තවල මූලික තක්සේරුවට අනුව, බලපත්‍රලාභී වාණිජ බැංකු ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට ණය ලබා දීමේ සාමාන්‍ය පොලී අනුපාතික සහ සියලුම

**රූප සටහන වි.ස. 6.3**

**අංශය අනුව ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වෙත ලබා දුන් ණය මත සාමාන්‍ය පොලී අනුපාතික**




*සටහන:* නව ණය මත වූ සාමාන්‍ය ණය පොලී අනුපාතික ඝණ රේඛා වලින් නිරූපණය වන අතර කැඩි රේඛා වලින් සමස්ත ණය ශේෂය මත වූ සාමාන්‍ය ණය පොලී අනුපාතික නිරූපණය කෙරේ.


මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

අංශ සඳහා සාමාන්‍ය වෙළඳපොළ ණය අනුපාතික වන බරිත සාමාන්‍ය ණය අනුපාතිකය (AWLR) හා බරිත සාමාන්‍ය නව ණය අනුපාතිකය (AWNLR) අතර වෙනස සාපෙක්ෂව කුඩා බව පෙන්නුම් කෙරේ. කෙසේ වෙතත්, ප්‍රමාණවත් තරම් ඉහළ ණය ශ්‍රේණිගත කිරීම් හා ඇපකර ශක්තියක් ඇති සාපේක්ෂව විශාල ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මගින් ලබා ගන්නා ඇතැයි අනුමාන කළ හැකි විශාල ණය ඇතුළත් නොකරමින් පොලී අනුපාතික ඇගයීමට ලක් කළ විට, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වෙත ලබා දුන් ණය පොලී අනුපාතික සහ සමස්ත ණය පොලී අනුපාතික අතර පරතරය විශාල විය.

ලිහිල් මුදල් තත්ත්වය හේතුවෙන් මෑතක දී සමස්ත වෙළඳපොළ පොලී අනුපාතික පහළ යෑම, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වෙත ලබා දුන් සාමාන්‍ය ණය පොලී අනුපාතිකවල ද නිරීක්ෂණය විය. මෙම සමීක්ෂණයට අනුව, සියලුම බලපත්‍රලාභී බැංකු විසින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ලබා දුන් සමස්ත ණය ශේෂය මත වූ බරිත සාමාන්‍ය පොලී අනුපාතිකය වන බරිත සාමාන්‍ය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය අනුපාතිකය (AWSR), 2020 වසර අවසානය වන විට සියයට 10.95ක් ලෙස වාර්තා වූ අතර, සියලුම බලපත්‍රලාභී බැංකු විසින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ලබා දුන් නව ණය මත වූ බරිත සාමාන්‍ය පොලී අනුපාතිකය වන බරිත සාමාන්‍ය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නව ණය අනුපාතිකය (AWNSR), 2020 දෙසැම්බර් මාසයේ දී සිදු කළ ණය දීම් සඳහා සියයට 8.53ක් විය. බලපත්‍රලාභී වාණිජ බැංකුවලට සාපේක්ෂව වැඩි වශයෙන් කුඩා ණය ලබා දෙන, බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ලබා දුන් ණය මත වූ සාමාන්‍ය ණය පොලී අනුපාතික


5 ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නිර්වචනය කර ඇති ආකාරය රටවල් අතර වෙනස් වේ. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් කල, විවිධ ආයතන ඔවුන්ගේ අරමුණු මත පදනම්ව විවිධ අර්ථකථන භාවිතා කරන බව පෙනී යයි (Department of Census and Statistics, 2015). කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය සමීක්ෂණය උදෙසා මහ බැංකුව විසින් මෑතක දී ඇතැම් නියෝග යටතේ නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට අනුකූලව, වාර්ෂික පිරිවැටුම රුපියල් බිලියන 1කට නොවැඩි සහ සේවකයින් 300කට අඩු සංඛ්‍යාවක් සහිත සේවා නියුක්ත ආයතන, මේ සඳහා සලකා බලන ලෙස බැංකුවලින් ඉල්ලා සිටින ලදී.

**රූප සටහන වි.ස. 6.4**
**2020 වසර අවසානය වන විට ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට ලබා දුන් සමස්ත ණය ශේෂයෙහි ආංශික වර්ගීකරණය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන වි.ස. 6.5**
**2020 වසර අවසානය වන විට ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට ලබා දුන් සමස්ත ණය ශේෂයෙහි ප්‍රාමාණික වර්ගීකරණය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉහළ අගයන් ගැනීම හේතුවෙන් සියලුම බලපත්‍රලාභී බැංකුවල ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ සාමාන්‍ය ණය පොලී අනුපාතික, සමස්ත වෙළඳපොළ ණය පොලී අනුපාතිකවලට වඩා ඉහළ අගයක් ගන්නා බව සොයා ගන්නා ලදී. 2020 වසර අවසානය වන විට ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වෙත ලබා දුන් සමස්ත ණය ශේෂයෙන්, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ලබා දුන් ණය කොටස සියයට 90.2ක් විය. මේ අතර, ලබා දුන් ණය සංඛ්‍යාව අනුව, 2020 වසර අවසානය වන විට බලපත්‍රලාභී වාණිජ බැංකුවල කොටස සියයට 50.2ක් විය.

කෘෂිකාර්මික අංශයේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වෙත බලපත්‍රලාභී බැංකු විසින් ලබා දෙන ලද ණය මත වූ පොලී අනුපාතික කර්මාන්ත සහ සේවා අංශවලට ලබා දුන් එම ණය පොලී අනුපාතිකවලට වඩා ඉහළ අගයක් ගත්තේය. තවද, ණය ප්‍රමාණය අනුව වර්ගීකරණය කළ විට, විශාල ණය මත සාමාන්‍ය පොලී අනුපාතික, කුඩා ණය මත සාමාන්‍ය පොලී අනුපාතිකවලට වඩා අඩු අගයක පැවතුණි. කෙසේ වෙතත්, මෙම සමීක්ෂණයේ ආරම්භයේ සිට, මධ්‍යම ප්‍රමාණයේ ණය කාණ්ඩ හා සැසඳීමේ දී, කුඩා ප්‍රමාණයේ ණය සඳහා ද සාපේක්ෂව අඩු පොලී අනුපාතික ලබා දී ඇති බව පෙනී යයි.

2020 වසර අවසානය වන විට ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට ලබා දුන් සමස්ත ණය ශේෂය රුපියල් බිලියන 743.0ක් වූ අතර,[6] එය බලපත්‍රලාභී බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දුන් මුළු ණය ප්‍රමාණයෙන්[7] සියයට 11.1කි. ණය ප්‍රමාණය සහ ණය සංඛ්‍යාව අනුව සලකා බැලීමේ දී, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට ලබා දුන් සමස්ත ණය ශේෂයෙන් මෙන්ම, නව ණය ප්‍රමාණයෙන් වැඩි කොටසක් කර්මාන්ත අංශයට ලබා දුන් ණය විය. කෘෂිකාර්මික අංශය ණය ප්‍රමාණය සහ ණය සංඛ්‍යාව අනුව සලකා බැලීමේ දී, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට ලබා දුන් සමස්ත ණය ශේෂයෙන් මෙන්ම, නව ණය ප්‍රමාණයෙන් කුඩාම කොටස වාර්තා කරන ලදී.

ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයට ලබා දුන් ණයෙහි කල්පිරීම් ව්‍යුහය සලකා බැලීමේ දී මෑත මාසවල දී ලබා දුන් බොහෝමයක් නව ණය, කෙටි කාලීන වන අතර, සමස්ත ණය ශේෂයෙහි කල්පිරීම් ව්‍යුහය ඒකාකාරීව විහිදී ගොස් ඇත.[8] කොවිඩ්-19 වසංගතය මධ්‍යයේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මුහුණ දෙනු ලැබූ මුදල් ප්‍රවාහ අඩාල වීම් මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය හැකිය. ව්‍යාපාරික ක්‍රමවේදවල වෙනස්කම් පිළිබිඹු කරමින් බැංකුවල ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ණය දීම්හි පැවති වෙනස්කම් පිළිබඳව ද මෙම සමීක්ෂණයේ සොයා ගැනීම් මගින් අනාවරණය විය.

### කලාපීය රටවල් හා සැසඳීමේ දී ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයේ මූල්‍යයනය

ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල නිර්වචන සහ අදාළ ආර්ථිකයන් තුළ එම අංශයේ සාපේක්ෂ වැදගත්කමෙහි ඇති වෙනස්කම් හේතුවෙන්, රටවල් අතර ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයට ලබා දුන් ණය සංසන්දනය අභියෝගාත්මක විය හැකිය. කෙසේ වෙතත්, පුළුල් අර්ථයකින් සලකා බැලීමේ දී, මෑත වසරවල දී ශ්‍රී ලංකාවේ ආර්ථික වේගය අභිබවා වර්ධනය වූ කොරියානු ජනරජය, මැලේසියාව සහ තායිලන්තය වැනි කලාපීය රටවල් හා සැසඳීමේ දී, විධිමත් බැංකු අංශය විසින් ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය වෙත ණය ලබා දීම, සාපේක්ෂව දුර්වල තත්ත්වයක පවතියි. ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර

6 බලපත්‍රලාභී බැංකු විසින් ලබා දුන් රුපියල් ණය පමණක් ඇතුළත් වන අතර අක්‍රීය ණය, ශේෂ පත්‍ර නොවන අයිතම (off balance sheet items) සහ රජයේ හා මහ බැංකුවේ ප්‍රති මූල්‍ය යෝජනා ක්‍රම යටතේ ලබා දුන් ණය ප්‍රමාණ ඇතුළත් නොවේ.

7 බලපත්‍රලාභී වාණිජ බැංකු (මුදල් සමීක්ෂණයෙන් ($M_2$) මනිනු ලබන පරිදි) සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු (මූල්‍ය සමීක්ෂණයෙන් ($M_4$) මනිනු ලබන පරිදි) පෞද්ගලික අංශයට ලබා දුන් මුළු රුපියල් ණය ප්‍රමාණය

8 වසරක් ඇතුළු කාලය සඳහා වූ ණය කෙටි කාලීන ණය ලෙසත්, වසරක සිට පස් වසරක් ඇතුළු කාලය සඳහා වූ ණය මැදි කාලීන ණය ලෙසත්, වසර පහකට වැඩි කාලයක් සඳහා වූ ණය දිගු කාලීන ණය ලෙසත් වර්ගීකරණය කර ඇත.

අංශය වෙත ලබා දුන් ණය කොටස අඩු අගයක පවතින අතර,[9] ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වෙත ලබා දුන් ණයෙහි පොලී අනුපාතික පරතරය, විශේෂයෙන්ම කුඩා ප්‍රමාණයේ ණය සඳහා වූ පොලී අනුපාතික, සහ ප්‍රමුඛ ගනුදෙනුකරුවන්ට ලබා දුන් ණයෙහි සාමාන්‍ය පොලී අනුපාතික අතර පරතරය ඉහළ අගයක පවතී. සාපේක්ෂව ඉහළ පොලී අනුපාතික පරතරයක් පැවතීම මගින්, මූල්‍ය වෙළඳපොළ සංවර්ධන මට්ටම, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල දුර්වල මූල්‍ය සාක්ෂරතාව සහ ඔවුන්ගේ බැංකු භාවිතය සඳහා ප්‍රවේශය යනාදී දායක සාධක සමූහයක් පිළිබිඹු විය හැකිය. සැම්සුන්, එල්ජී, හයුන්ඩායි වැනි ලෝකයේ විශාලතම සමාගම් කිහිපයකටම මව් රට වුවත්, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විසින් නිෂ්පාදන අගය එකතු කළ කොටස 2014 වසරේ දී සියයට 49ට අධික අගයක පැවතීම[10] හරහා කොරියානු ජනරජය අත්දකින ලද සාර්ථකත්වය මගින්, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය ප්‍රවර්ධනය කිරීමේ වැදගත්කම නිරීක්ෂණය කළ හැකිය.

**සංඛ්‍යා සටහන වි.ස. 6.1**
**තෝරාගත් කලාපීය රටවල ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මූල්‍යනය**

| රට | ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වෙත ලබා දුන් සමස්ත ණය ශේෂය, මුළු ව්‍යාපාර ණය සමස්තයේ කොටසක් ලෙස (2017 අවසානයට,[11] සියයට) | විශාල ව්‍යාපාරවලට ලබා දුන් ණයෙහි සහ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට ලබා දුන් ණයෙහි පොලී අනුපාතික පරතරය (2017 අවසානයට,[11] පදනම් අංක) |
|---|---|---|
| කොරියානු ජනරජය | 80.2 | 31 |
| මැලේසියාව | 50.6 | 217 |
| තායිලන්තය | 50.5 | ලැ.නො. |
| ඉන්දුනීසියාව | 19.9 | 167 |
| ශ්‍රී ලංකාව | 14.1[12] | 246[13] |

මූලයන්: OECD (2019), ශ්‍රී ලංකා මහ බැංකුව

9 කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය සමීක්ෂණයට අනුව, බලපත්‍රලාභී බැංකු විසින් ලබා දුන් ණය පමණක් සලකා බැලිණි.

10 Jones and Lee (2018) බලන්න.

11 ආර්ථික සහයෝගීතාව සහ සංවර්ධනය සඳහා වන සංවිධානයේ (OECD, 2019) ලකුණු පුවරුවෙහි 2007-17 කාලය යන සඳහා තොරතුරු ඇතුළත් වේ.

12 2020 වසර අවසන් වන විට, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය සමීක්ෂණය මගින් මනින ලද, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වලට ලබා දුන් ණය සමස්තය පෞද්ගලික අංශයට වාණිජ බැංකු විසින් ලබා දුන් ණය සහ අත්තිකාරම් පිළිබඳ කාර්තුමය සමීක්ෂණය මගින් මනින ලද, කෘෂිකාර්මික, කර්මාන්ත සහ සේවා අංශ වෙත ලබා දුන් මුළු ණයෙහි කොටසක් ලෙස.

13 විශාල ව්‍යාපාර සඳහා අදාළ පොලී අනුපාතිකයක් දැනට නොපවතින බැවින්, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය සමීක්ෂණය මගින් මනින ලද, බලපත්‍රලාභී වාණිජ බැංකු මගින් 2020 දෙසැම්බර් මාසයේ දී ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට ලබා දුන් නව ණය මත වූ බරිත සාමාන්‍ය පොලී අනුපාතිකය සහ අනුරූප මාසය සඳහා මාසික බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය (AWPR) අතර පොලී අනුපාතික පරතරය සලකනු ලැබේ.

**ඉදිරි දැක්ම**

අඩු පිරිවැය මූල්‍යකරණය සඳහා වූ සීමිත ප්‍රවේශය ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය හමුවේ ඇති ප්‍රධාන බාධකයක් ලෙස පවතින බව ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා බැංකු ණය දීම පිළිබඳ නව සමීක්ෂණය දත්ත මගින් තහවුරු කෙරේ. කොවිඩ්-19 වසංගතය පැතිරීම මධ්‍යයේ දක්වන ලද සහය, ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (CRIB) විසින් ණය සඳහා ලකුණු ප්‍රදානය කිරීමේ ක්‍රමයක් (credit scoring) හඳුන්වා දීම, "සවිබල ගැන්වීමේ මණ්ඩලය" (Empower Board) වැනි කර්තව්‍යයන් ඔස්සේ කොළඹ කොටස් වෙළඳපොළ හරහා කොටස් ප්‍රාග්ධනයට ප්‍රවේශ වීමට ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිරි ගැන්වීම, සහ ප්‍රමුඛ අංශ සඳහා ණය ලබා දීමේ ඉලක්ක ක්‍රියාත්මක කිරීම වැනි මෑත කාලීන ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මගින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයට වර්තමාන ආර්ථික අර්බුදයට සාර්ථකව මුහුණ දීමට මෙන්ම, මැදි හා දිගු කාලීන වර්ධන ශක්‍යතාව කරා ළඟා වීමට සහාය විය හැකිය. වඩා පුළුල් ණය ඇපකර යෝජනා ක්‍රම හඳුන්වා දීම හෝ නිත්‍ය ණය ඇපකර ආයතනයක් පිහිටු වීම වැනි ක්‍රියාමාර්ග ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ මූල්‍ය ප්‍රවේශය වැඩි දියුණු කිරීමට සහාය වනු ඇති අතර, මෙම අංශය තුළ පිළිගත හැකි ඇපසුරැකුම් ඌන වීමේ දිගු කාලීනව පවතින ගැටලුවට එමගින් පිළියම් යෙදෙනු ඇත.

**මූලාශ්‍ර:**


1. Asian Development Bank (2017) *Small and Medium-sized Enterprises Line of Credit Project - Additional Financing: Report and Recommendation of the President* [Online]. Available at: https://www.adb.org/projects/documents/sri-49273-002-rrp (Accessed: 27 January 2021)

2. Department of Census and Statistics (2015) *Non-Agricultural Economic Activities in Sri Lanka, Economic Census 2013/2014 - Listing Phase* [Online]. Available at: http://www.statistics.gov.lk/Economic/Non%20agri.pdf (Accessed: 27 January 2021)

3. International Labour Organization (2019) *The power of small: Unlocking the potential of SMEs* [Online]. Available at: https://www.ilo.org/infostories/en-GB/Stories/Employment/SMEs (Accessed: 22 March 2021)

4. Jones, R.S. and Lee, J.W. (2018) 'Enhancing Dynamism in SMEs and Entrepreneurship in Korea', *Economics Department Working Papers No. 1510, OECD* [Online]. Available at: www.oecd.org/eco/workingpapers (Accessed: 25 March 2021)

5. Ministry of Industry and Commerce (2016) *National Policy Framework for Small and Medium Enterprises (SMEs) Development - Action Plan* [Online]. Available at: http://www.industry.gov.lk/web/images/pdf/gg.pdf (Accessed: 21 March 2021)

6. OECD (2019) *Financing SMEs and Entrepreneurs 2019: An OECD Scoreboard*, OECD Publishing, Paris [Online]. Available at: https://doi.org/10.1787/fin_sme_ent-2019-en (Accessed: 25 March 2021)

ව්‍යාපාරවලට ලබාදෙන ණය පිළිබඳ නව සමීක්ෂණයක් ආරම්භ කරන ලදී. සමීක්ෂණ ප්‍රතිඵලවලට අනුව, බලපත්‍රලාභී බැංකු විසින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ලබා දුන් ණය මත සාමාන්‍යය පොලී අනුපාතික, බලපත්‍රලාභී වාණිජ බැංකුවල සමස්ත සාමාන්‍ය ණය අනුපාතිකවල ප්‍රවණතාවය පෙන්නුම් කළ ද, 2020 වසර අවසානය වන විට බරිත සාමාන්‍ය කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය අනුපාතිකය (AWSR)[10] සහ බරිත සාමාන්‍ය කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර නව ණය අනුපාතිකය (AWNSR),[11] පිළිවෙලින්, සියයට 10.95ක් සහ සියයට 8.53ක් ලෙස ඉහළ අගයන්වල පැවතිණි. තවද, කර්මාන්ත සහ සේවා අංශවල කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට ලබා දුන් ණය පොලී අනුපාතිකවලට වඩා, කෘෂිකාර්මික අංශයේ කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට ලබා දුන් ණය පොලී අනුපාතික, සාමාන්‍යයක් ලෙස, ඉහළ අගයක පැවතුණි.

**සෑම වසරක් අවසානයේදීම මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලැබ රජයේ ගැසට් පත්‍රයෙහි ප්‍රකාශයට පත් කරනු ලබන නෛතික පොලී අනුපාතිකය සහ වෙළඳපොළ පොලී අනුපාතිකය,[12] 2020 වසර සඳහා වූ සියයට 11.64 හා සැසඳීමේ දී 2021 වසර සඳහා සියයට 10.12ක් විය.** 2021 වසර සඳහා නෛතික සහ වෙළඳපොළ පොලී අනුපාතික, 2020 වසරේ ඔක්තෝබර් මාසය ද ඇතුළුව, ඉන් පෙර මාස 12ක් සඳහා වන බලපත්‍රලාභී වාණිජ බැංකුවල බරිත සාමාන්‍ය තැන්පතු පොලී අනුපාතික සහ බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකවල සරල සාමාන්‍යය මත පදනම්ව ගණනය කර ඇත.

## විදේශ විනිමය තැන්පතු මත වන පොලී අනුපාතික

**බලපත්‍රලාභී වාණිජ බැංකුවල පවත්වා ගෙන යන විදේශ විනිමය තැන්පතු මත වන පොලී අනුපාතික 2020 වසරේ දී මිශ්‍ර හැසිරීම් පෙන්නුම් කෙරිණි.** වසංගතයෙන් බලපෑමට ලක් වූ ආර්ථිකයන්ට සහාය ලබා දීම සඳහා ලොව පුරා මහ බැංකු 2020 වසරේ දී සැලකිය යුතු ප්‍රතිපත්ති ලිහිල්කරණයක් ක්‍රියාත්මක කරන ලදී. 2020 වසරේ දී, එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුව එහි ෆෙඩරල් අරමුදල් ඉලක්ක අනුපාතිකය පදනම් අංක 150කින් ද, එංගලන්ත මහ බැංකුව එහි නිල බැංකු අනුපාතිකය පදනම් අංක 65කින් ද පහත දැමූ අතර, යුරෝපා මහ බැංකුව ප්‍රතිමූල්‍ය අනුපාතිකය නොවෙනස්ව ශුන්‍ය මට්ටමේ පවත්වා ගෙන ගියේය. කෙසේ වෙතත්, දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ විදේශ මුදල් ද්‍රවශීලතා හිඟ තත්ත්වය මධ්‍යයේ විදේශ මුදල් තැන්පතු ආකර්ශනය කර ගැනීමට දේශීය බලපත්‍රලාභී බැංකු තරඟ කිරීමත් සමඟ, දේශීය බලපත්‍රලාභී බැංකුවල විදේශ මුදල් තැන්පතු මත පොලී අනුපාතිකවල අඩුවීම, ගෝලීය පොලී අනුපාතිකවල ප්‍රවණතාව හා අනුකූල නොවුණි. එ.ජ. ඩොලර්වලින් පවත්වා ගෙන යනු ලබන ඉතුරුම් තැන්පතුවලට අදාළ පොලී අනුපාතික 2019 වසර අවසානයේ දී වූ සියයට 0.02-4.50 පරාසය හා සැසඳීමේ දී 2020 වසර අවසානය වන විට සියයට 0.03-4.00 අතර පරාසයක වාර්තා විය. ස්ටර්ලිං පවුම්වලින් පවත්වා ගෙන යනු ලබන ඉතුරුම් තැන්පතු සඳහා වන පොලී අනුපාතික 2019 වසර අවසානයේ වූ සියයට 0.10-2.46 පරාසය හා සැසඳීමේ දී 2020 වසර අවසානය වන විට සියයට 0.03-3.00 අතර පරාසයක රැඳී පැවතුණි. මේ අතර, එ.ජ. ඩොලර්වලින් පවත්වා ගෙන යනු ලබන කාලීන තැන්පතු සඳහා අදාළ පොලී අනුපාතික 2019 වසර අවසානයේ දී සියයට 0.20-5.50 පරාසය හා සැසඳීමේ දී 2020 වසර අවසානය වන විට සියයට 0.10-6.00ක් අතර පරාසයක පැවතුණි. තවද, ස්ටර්ලිං පවුම්වලින් පවත්වා ගෙන යනු ලබන කාලීන තැන්පතුවලට අදාළ පොලී අනුපාතික 2019 වසර අවසානයේ දී වාර්තා වූ සියයට 0.10 -3.52 පරාසය හා සැසඳීමේ දී 2020 වසර අවසානය වන විට සියයට 0.05-4.25 අතර පරාසයක පැවතුණි. මේ අතර, විදේශ මුදල් තැන්පතු රට තුළට ආකර්ෂනය කර ගැනීමේ අරමුණ ඇතිව, රජය විසින් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ද උපදෙස් මත 2020 අප්‍රේල් මාසයේ දී අලුතින් හඳුන්වා දෙනු ලැබූ විශේෂ තැන්පතු ගිණුම්වලට විදේශ මුදල් තැන්පතු ලබා ගැනීමට බලපත්‍රලාභී වාණිජ බැංකුවලට සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුවට අවසර ලබා දුන්නේය. මෙම විශේෂ තැන්පතු ගිණුම් මාස හයක තැන්පතුවක් වෙනුවෙන් සාමාන්‍ය අනුපාතිකයට වඩා වාර්ෂිකව සියයට 1ක අමතර පොලියක් ද, මාස දොළහක තැන්පතු සඳහා සාමාන්‍ය අනුපාතිකයට වඩා වාර්ෂිකව සියයට 2ක අමතර පොලියක් ද ලබා දුණි.

10 බරිත සාමාන්‍ය කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය අනුපාතිකය (AWSR) ගණනය කිරීමේදී, රජයේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රම ඇතුළත් නොවන අතර, බලපත්‍රලාභී බැංකු විසින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ලබා දුන් සියලුම රුපියල් ණය සහ අත්තිකාරම් වල පොලී අනුපාතික මත පදනම් වේ.

11 බරිත සාමාන්‍ය කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර නව ණය අනුපාතිකය (AWNSR), රජයේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රම ඇතුළත් නොවන අතර, බලපත්‍රලාභී බැංකු විසින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ලබා දුන් සියලුම නව රුපියල් ණය සහ අත්තිකාරම් වල පොලී අනුපාතික මත පදනම් වේ.

12 නෛතික පොලී අනුපාතිකය 1990 අංක 06 දරන සිවිල් විධාන සංග්‍රහය (සංශෝධන) පනතේ නිර්වචනය කර ඇති අතර, එය මුදලක් අයකර ගැනීම සම්බන්ධයෙන් වූ ඕනෑම නීතිමය ක්‍රියාමාර්ගයක දී අදාළ වේ. වෙළඳපොළ පොලී අනුපාතිකය, 1990 අංක 2 දරන ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ නිර්වචනය කර ඇති අතර, ණය දෙන ආයතන විසින් වාණිජමය ගනුදෙනුවක් සම්බන්ධයෙන් වූ නීතිමය ක්‍රියාමාර්ගයක දී රුපියල් 150,000කට වඩා වැඩි ණය මුදලක් අය කරගැනීමේ දී, ඒ සඳහා එකඟ වූ පොලී අනුපාතිකයක් නොමැති විටෙක අදාළ වේ.


## 7.4 මුදල් සහ ණය සමස්තවල ප්‍රවණතා

### සංචිත මුදල්

**ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය අඩු කිරීම සහ සංසරණයෙහි පවතින ව්‍යවහාර මුදල් ඉහළ යෑමේ මිශ්‍ර බලපෑම පිළිබිඹු කරමින්, ආර්ථිකයේ මුදල් පදනම වන සංචිත මුදල් 2020 වසරේ දී අඩු වර්ධනයක් වාර්තා කළේය.** 2020 වසරේ දී ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ප්‍රතිශතාංක 3කින් අඩු කිරීමත් සමඟ, එම වසරේ දී බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වා ගෙන යනු ලබන තැන්පතු ප්‍රමාණය අඩු කරමින්, රුපියල් බිලියන 180ක පමණ ද්‍රවශීලතාවක් මුදල් වෙළඳපොළට නිකුත් කෙරිණි. කෙසේ වෙතත්, 2020 වසරේ දෙවන භාගයේ දී බලපත්‍රලාභී වාණිජ බැංකු සතු තැන්පතු පදනම ඉහළ යෑමත් සමඟ, ශ්‍රී ලංකා මහ බැංකුවේ පවතින වාණිජ බැංකු සංචිත 2020 වසර අවසානය වන විට ඉහළ යෑමක් වාර්තා කළේය. කෙසේ වෙතත්, 2020 වසර අවසානය වන විට, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වා ගෙන යනු ලබන තැන්පතු වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 49.1ක අඩු වීමක් වාර්තා කළ අතර, වසර තුළ දී රුපියල් බිලියන 129.6ක් දක්වා රුපියල් බිලියන 125.0කින් අඩු විය. වසංගතය මධ්‍යයේ මුදල් සඳහා පැවති ඉහළ ඉල්ලුම සහ අඩු තැන්පතු අනුපාතික හේතුවෙන් මුදල් ළඟ තබා ගැනීමේ අඩු ආවස්ථික පිරිවැය පිළිබිඹු කරමින් 2020 වසර මුළුල්ලේ සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් ඉහළ මට්ටමක පැවතිණි. කොවිඩ්-19 වසංගතය සහ ඒ ආශ්‍රිතව පැන වූ සංචරණ සීමාවන් සමඟ ඇති වූ අවිනිශ්චිතතා හේතුවෙන්, ආරක්ෂණ පිළිවෙතක් ලෙස මුදල් සඳහා වන ඉල්ලුම ඉහළ ගිය අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2020 මාර්තු මස අවසානයේ සිට 2020 අප්‍රේල් මස මැද දක්වා කාලය තුළ දී සංසරණයෙහි පවතින ව්‍යවහාර මුදල් ඉහළ ගියේය. කොවිඩ්-19 දෙවන රැල්ලේ ව්‍යාප්තිය ද සංසරණයෙහි පවතින ව්‍යවහාර මුදල් තවදුරටත් ඉහළ යෑමට හේතු විය. ඒ අනුව, සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් 2019 වසරේ දී පැවති රුපියල් බිලියන 37.0ක ප්‍රසාරණය හා සැසඳීමේ දී, 2020 වසර අවසානය වන විට රුපියල් බිලියන 834.8ක් දක්වා රුපියල් බිලියන 156.8කින් ඉහළ ගියේය. වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් 2019 වසර අවසානයේ පැවති සියයට 5.8ක වර්ධනය හා සැසඳීමේ දී, 2020 වසර අවසානය වන විට සියයට 23.1ක වර්ධනයක් වාර්තා කළේය. ඒ අනුව, සංචිත මුදල් මත ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයේ සැලකිය යුතු අඩු වීම මගින් වූ සෘණාත්මක බලපෑමට වඩා, 2020 වසරේ දී සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් ඉහළ යෑම මගින් වූ බලපෑම වැඩි වීමේ ප්‍රතිඵලයක් ලෙස, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සංචිත මුදල්, 2019 වසර අවසානයේ දී වාර්තා වූ සියයට 3.0ක අඩු වීම හා සැසඳීමේ දී 2020 වසර අවසානය වන විට, සියයට 3.4කින් ඉහළ ගියේය. ඒ අනුව, සංචිත මුදල්, 2019 වසරේ වූ රුපියල් බිලියන 28.5ක අඩු වීම හා සැසඳීමේ දී 2020 වසරේ දී රුපියල් බිලියන 964.4ක් දක්වා රුපියල් බිලියන 31.8කින් ඉහළ ගියේය.

**වත්කම් අනුව සලකා බැලීමේ දී, 2020 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම් ප්‍රසාරණය වීම සංචිත මුදල්වල වැඩි වීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූ අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් වසර තුළ දී අඩු විය.** රජය විසින් ප්‍රාථමික වෙළඳපොළෙන් රජයේ සුරැකුම්පත් මිලදී ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස රජයට ලබා දුන් ශුද්ධ ණය ඉහළ යෑම හේතුවෙන්, 2020 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම් සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, කොවිඩ්-19 වසංගතය මධ්‍යයේ සහනදායී ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත ලබා දුන් ණය ප්‍රමාණය ද ඉහළ ගියේය. ශ්‍රී ලංකා

**7.11 රූප සටහන**
**මහ බැංකු ශේෂ පත්‍රයේ සංයුතිය**




මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

මහ බැංකුව ප්‍රාථමික වෙළඳපොළ භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිවල දී ලංසු පිළිගැනීම සඳහා වූ උපරිම එළඹා අනුපාතික යටතේ සහභාගීවන්නන් විසින් මිලදී නොගත් භාණ්ඩාගාර බිල්පත් කොටස මිලදී ගැනීම හේතුවෙන්, මහ බැංකුව සතු රජයේ සුරැකුම්පත් තොගය (ප්‍රතිමිලදී ගැනීම් හා ප්‍රතිවිකුණුම්හි ශුද්ධ අගය ගැළපීමෙන් පසු) 2020 වසර අවසානය වන විට රුපියල් බිලියන 717.3ක් දක්වා රුපියල් බිලියන 590.4කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. තවද, වසංගතයෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාරවලට සහාය දැක්වීම සඳහා රජය විසින් ගනු ලැබූ ප්‍රයත්නයන්ට තවදුරටත් උපකාරී වීමට 1949 අංක 58 දරන මුදල් නීති පනතේ විධිවිධාන යටතේ ගන්නා ලද පියවරවලට අනුකූල වෙමින්, සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන පහසුකම සහ රජයේ කොන්ත්‍රාත්කරුවන්ට සහ සැපයුම්කරුවන්ට ද්‍රවශීලතා පහසුකම ක්‍රියාත්මක කිරීමත් සමඟ, ශ්‍රී ලංකා මහ බැංකුව බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත ලබා දුන් ණය ද, 2020 වසරේ දෙවන භාගයේ දී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත ලබා දුන් ණය 2020 වසර අවසානය වන විට රුපියල් බිලියන 114.5ක් දක්වා රුපියල් බිලියන 112.7කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. වෙළඳපොළ සහභාගිවන්නන් අතිරික්ත ද්‍රවශීලතාව ප්‍රධාන වශයෙන් එක් දින පදනම මත තැන්පත් කිරීම සඳහා මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම අඛණ්ඩව භාවිතා කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2019 වසරේ දී රුපියල් බිලියන 25ක සාමාන්‍යයක් ලෙස පැවති නිත්‍ය තැන්පතු පහසුකම යටතේ පවතින ශේෂය 2020 වසරේ දී රුපියල් බිලියන 130ක පමණ සාමාන්‍යයක් දක්වා ඉහළ ගියේය. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම්, 2019 වසරේ දී වූ රුපියල් බිලියන 173.9ක අඩු වීම හා සැසඳීමේ දී, 2020 වසරේ දී රුපියල් බිලියන 437.7ක් දක්වා රුපියල් බිලියන 401.1කින් ඉහළ ගියේය. අනාගතයේ දී උද්ධමනකාරී පීඩන ඇති වීම වැළැක්වීම සඳහා ශුද්ධ දේශීය වත්කම්හි එවැනි ඉහළ යෑම්, සමස්ත ඉල්ලුම් තත්ත්ව යථා තත්ත්වයට පත් වීමෙන් පසු නැවත අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ මූල්‍ය වත්කම් අඩු වීම සහ විදේශ මූල්‍ය වගකීම් වැඩි වීම හේතුවෙන් මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් 2020 වසරේ දී රුපියල් බිලියන 369.2කින් අඩු විය. රජයේ විදේශ ණය සේවාකරණ ගෙවීම් හේතුවෙන් 2020 වසරේ අවසානය වන විට විදේශ මූල්‍ය වත්කම් අඩු විය. 2020 සැප්තැම්බර් මාසයේ දී නිව්යෝර්ක්හි ෆෙඩරල් සංචිත බැංකුව සමඟ එළඹුණු එක්සත් ජනපද ඩොලර් බිලියන 1.0ක ප්‍රතිමිලදී ගැනුම් ගිවිසුම සහ 2020 ජූලි මාසයේ දී ඉන්දියානු සංචිත බැංකුව සමඟ එළඹුණු එක්සත් ජනපද ඩොලර් මිලියන 400ක ද්විපාර්ශ්වික ව්‍යවහාර මුදල් ගිවිසුම ප්‍රධාන වශයෙන් හේතු වෙමින්, ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ මූල්‍ය වගකීම් වැඩි විය.

**සංචිත මුදල් සහ පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) අතර සම්බන්ධය පෙන්නුම් කරනු ලබන මුදල් ගුණකය, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය අඩු කිරීම සහ $M_{2b}$ මුදල් සැපයුමෙහි සැලකිය යුතු වර්ධනයේ බලපෑම පිළිබිඹු කරමින් 2020 වසරේ දී ඉහළ ගියේය.** $M_{2b}$ මුදල් ගුණකය 2019 වසර අවසානයේ දී පැවති 8.18 සිට 2020 වසර අවසානයේ දී 9.75ක් දක්වා ඉහළ ගියේය. 2020 වසර තුළ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය අඩු කිරීම මගින් බැංකු පද්ධතියේ මුදල් මැවීම සඳහා තිබෙන අවකාශය වර්ධනය විය. මේ අතර, මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් සඳහා ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන්, ව්‍යවහාර මුදල් හා තැන්පතු අතර අනුපාතය, 2019 වසරේ වාර්තා වූ සියයට 6.9 සිට 2020 වසර අවසානය වන විට සියයට 7.3ක් දක්වා ඉහළ ගියේය.

### පුළුල් මුදල් ($M_{2b}$) සැපයුම සහ දේශීය ණය

**රාජ්‍ය අංශය වෙත සපයන ලද ණය ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතුවෙමින්, බැංකු පද්ධතියේ ශුද්ධ දේශීය වත්කම් ප්‍රසාරණය වීමත් සමඟ, 2020 වසරේ දී පුළුල් මුදල් ($M_{2b}$) සැපයුමේ වර්ධනය ඉහළ ගිය අතර, වසර තුළ දී බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් පහළ ගියේය.** මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීමේ ක්‍රියාමාර්ගවල බලපෑම පිළිඹිමු කරමින් පුළුල් මුදල් සැපයුමේ වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2019 වසර අවසානයේ පැවති සියයට 7.0 හා සැසඳීමේ දී, 2020 වසර අවසානය වන විට සියයට 23.4ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. දේශීය ණය ඉහළ යෑම, ප්‍රධාන වශයෙන්, රජය වෙත සපයන ලද ශුද්ධ ණය වසර තුළදී රුපියල් බිලියන 1,752.1කින් ඉහළ යෑම හේතුවෙන්, 2020 වසර තුළ දී බැංකු පද්ධතියේ ශුද්ධ දේශීය වත්කම් රුපියල් බිලියන 2,091.8කින් ඉහළ ගියේය. 2020 වසර තුළ දී බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් රුපියල් බිලියන 310.2කින් පහළ ගියේය.

**පුළුල් මුදල් සැපයුමේ වගකීම් අංශය සැලකූ විට, බලපත්‍රලාභී වාණිජ බැංකුවල පවත්වා ගෙන යනු ලබන මහජනයා සතු කාලීන හා ඉතිරිකිරීමේ තැන්පතු ඉහළ යෑම 2020 වසර තුළ දී මුදල් ප්‍රසාරණයට ප්‍රධාන වශයෙන් දායක විය.** වසංගතය පැවති කාලසීමාව තුළ පාරිභෝගික


7

වියදම් අඩුවීම මෙන්ම, බැංකු නොවන අංශයට වඩා බැංකු අංශයේ ඉතිරි කිරීමට ඇති කැමැත්ත ඉහළ යෑම පිළිබිඹු කරමින්, බලපත්‍රලාභී වාණිජ බැංකුවල පවත්වා ගෙන යනු ලබන මහජනයා සතු කාලීන හා ඉතිරිකිරීමේ තැන්පතු ප්‍රමාණය සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2019 වසර අවසානයේ පැවති සියයට 7.3 හා සැසඳීමේ දී 2020 වසර අවසානය වන විට සියයට 21.7ක වර්ධනයක් වාර්තා කළේය. මේ අතර, වසර තුළ පැවති වසංගත තත්ත්වය සහ වෙළඳපොළ පොලී අනුපාතික සැලකිය යුතු ලෙස පහළ යෑම මධ්‍යයේ මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් සහ වාණිජ බැංකුවල පවත්වා ගෙන යනු ලබන මහජනයා සතු ඉල්ලුම් තැන්පතු ද ($M_1$) ඉහළ ගොස් ඇති අතර, එමගින් පුළුල් මුදල්හි සමස්ත ප්‍රසාරණය සඳහා දායකත්වය 2019 වසර හා සැසඳීමේ දී 2020 වසර තුළ දී ඉහළ ගියේය.

**පුළුල් මුදල් සැපයුමේ වත්කම් අංශය සැලකූ විට, බලපත්‍රලාභී වාණිජ බැංකුවල ශුද්ධ විදේශීය වත්කම්වල ඉහළ යෑමක් වසර තුළ දී වාර්තා වුව ද, ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් පහළ යෑම හේතුවෙන්, 2020 වසර තුළ දී බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් පහළ ගියේය.** විදේශ සංචිත උපයෝගී කර ගනිමින් රජයේ විදේශ ණය ආපසු ගෙවීම් හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් 2020 වසර තුළ දී සැලකිය යුතු ලෙස පහළ ගියේය. දේශීය බැංකු ඒකකවල ශුද්ධ විදේශීය වත්කම් පහළ යෑම මධ්‍යයේ, අක්වෙරළ බැංකු ඒකකවල ශුද්ධ විදේශීය වත්කම් ප්‍රසාරණය වීම හේතුවෙන්, 2020 වසර තුළ දී

**7.12 රූප සටහන**

**පුළුල් මුදල්වල ($M_{2b}$) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස සඳහා තුඩු දුන් සාධක (වත්කම් අනුව)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**7.4 සංඛ්‍යා සටහන**

**මුදල් සමස්තවල ප්‍රවණතා**

රුපියල් බිලියන

| අයිතමය | 2019 අවසානයට | 2020 අවසානයට (අ) | වෙනස 2019 ප්‍රමාණය | 2019 % | 2020 ප්‍රමාණය | 2020 % |
|---|---|---|---|---|---|---|
| 1. සමස්ත ව්‍යවහාර මුදල් එකතුව | 678.0 | 834.8 | 37.0 | 5.8 | 156.8 | 23.1 |
| 1.1 මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් | 494.2 | 641.0 | 21.1 | 4.5 | 146.8 | 29.7 |
| 1.2 වාණිජ බැංකු වෙතැති ව්‍යවහාර මුදල් | 183.8 | 193.8 | 15.9 | 9.5 | 10.0 | 5.5 |
| 2. මහ බැංකුව වෙතැති වාණිජ බැංකු තැන්පතු (ආ) | 254.6 | 129.6 | -65.5 | -20.5 | -125.0 | -49.1 |
| 3. මහ බැංකුව වෙතැති රාජ්‍ය නියෝජිත ආයතනවල තැන්පතු (ඇ) | 0.1 | 0.03 | | | | |
| **4. සංචිත මුදල් (1 + 2 + 3)** | **932.6** | **964.4** | **-28.5** | **-3.0** | **31.8** | **3.4** |
| 5. වාණිජ බැංකු වෙතැති මහජනයා සතු ඉල්ලුම් තැන්පතු | 371.3 | 536.1 | 13.5 | 3.8 | 164.9 | 44.4 |
| **6. පටු මුදල් සැපයුම, $M_1$ (1.1 + 5)** | **865.5** | **1,177.2** | **34.7** | **4.2** | **311.7** | **36.0** |
| 7. මහජනයා සතු වාණිජ බැංකු වෙතැති කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතු | 6,047.2 | 7,318.6 | 450.7 | 8.1 | 1,271.4 | 21.0 |
| **8. පුළුල් මුදල් සැපයුම, $M_2$ (6 + 7)** | **6,912.7** | **8,495.8** | **485.4** | **7.6** | **1,583.1** | **22.9** |
| 9. ගැළපුම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු (ඈ) | 711.4 | 909.9 | 10.4 | 1.5 | 198.5 | 27.9 |
| **10. ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම, $M_{2b}$ (8 + 9)** | **7,624.1** | **9,405.7** | **495.8** | **7.0** | **1,781.6** | **23.4** |
| **මුදල් ගුණකය, $M_{2b}$** | **8.18** | **9.75** | | | | |
| **සංසරණ ප්‍රවේගය, $M_{2b}$ (ඉ)** | **2.04** | **1.76** | | | | |

(අ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(ආ) මහ බැංකුව වෙතැති වාණිජ බැංකු තැන්පතු සහ මහ බැංකුව වෙතැති ප්‍රාථමික වෙළඳුන්ගේ තැන්පතු ඇතුළත් වේ.

(ඇ) මහ බැංකුව වෙතැති රාජ්‍ය නියෝජිත ආයතනවල තැන්පතු 2019 වසර අවසානයේ දී රුපියල් මිලියන 55.7 ක් ලෙස ද, 2020 අවසානයේ දී රුපියල් මිලියන 30.4 ක් ලෙස ද පැවතුණි.

(ඈ) අක්වෙරළ බැංකු ඒකකවල නේවාසික තැන්පතු සහ දේශීය බැංකු ඒකකවල විදේශ ව්‍යවහාර මුදල් තැන්පතුවලින් දේශීය වගකීම් ලෙස හඳුනාගත් කොටසක් ඇතුළත් වේ.

(ඉ) වසර සඳහා සාමාන්‍යය.

7

**7.5 සංඛ්‍යා සටහන**

**සංචිත මුදල් සහ පුළුල් මුදල් ($M_{2b}$) සැපයුමෙහි වත්කම් අංශය**

රුපියල් බිලියන

| අයිතමය | 2019 අවසානයට (අ) | 2020 අවසානයට (ආ) | වෙනස 2019 ප්‍රමාණය | 2019 % | වෙනස 2020 ප්‍රමාණය | 2020 % |
|---|---|---|---|---|---|---|
| **සංචිත මුදල්** | **932.6** | **964.4** | **-28.5** | **-3.0** | **31.8** | **3.4** |
| මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් | 896.0 | 526.8 | 145.5 | 19.4 | -369.2 | -41.2 |
| මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම් | 36.6 | 437.7 | -173.9 | -82.6 | 401.1 | 1,095.6 |
| රජයට ලබා දුන් ශුද්ධ ණය | 363.0 | 868.9 | -109.8 | -23.2 | 505.9 | 139.3 |
| වාණිජ බැංකුවලට ලබා දුන් ණය | 1.8 | 114.5 | 12.9 | 116.4 | 112.7 | 6,181.0 |
| අනෙකුත් අයිතම (ඇ) | -328.2 | -545.7 | -77.1 | -30.7 | -217.5 | -66.2 |
| **පුළුල් මුදල් ($M_{2b}$)** | **7,624.1** | **9,405.7** | **495.8** | **7.0** | **1,781.6** | **23.4** |
| ශුද්ධ විදේශීය වත්කම් | 100.7 | -209.5 | 167.7 | 250.3 | -310.2 | -308.0 |
| මුදල් අධිකාරීන් (ඈ) | 896.0 | 526.8 | 145.5 | 19.4 | -369.2 | -41.2 |
| වාණිජ බැංකු | -795.3 | -736.2 | 22.3 | 2.7 | 59.0 | 7.4 |
| ශුද්ධ දේශීය වත්කම් | 7,523.4 | 9,615.2 | 328.1 | 4.6 | 2,091.8 | 27.8 |
| දේශීය ණය | 9,410.7 | 11,721.2 | 577.3 | 6.5 | 2,310.4 | 24.6 |
| රජයට ලබා දුන් ශුද්ධ ණය | 2,795.9 | 4,548.1 | 279.2 | 11.1 | 1,752.1 | 62.7 |
| මහ බැංකුව | 363.0 | 868.9 | -109.8 | -23.2 | 505.9 | 139.3 |
| වාණිජ බැංකු | 2,432.9 | 3,679.2 | 389.0 | 19.0 | 1,246.3 | 51.2 |
| රාජ්‍ය සංස්ථාවලට ලබා දුන් ණය | 818.0 | 1,002.2 | 62.6 | 8.3 | 184.2 | 22.5 |
| පෞද්ගලික අංශයට ලබා දුන් ණය | 5,796.9 | 6,170.9 | 235.5 | 4.2 | 374.1 | 6.5 |
| අනෙකුත් අයිතම (ශුද්ධ) (ඇ) | -1,887.3 | -2,106.0 | -249.2 | -15.2 | -218.7 | -11.6 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) අනෙකුත් අයිතම වත්කම් සහ අනෙකුත් අයිතම වගකීම් අතර වෙනස මඟින් ගණනය කරනු ලැබේ.
(ඈ) ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් මෙන්ම රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් වාර්තා කරනු ලබන රජයේ රන් පවුම් ශේෂය ද මෙහි අන්තර්ගත වේ.


මූලයː ශ්‍රී ලංකා මහ බැංකුව

බලපත්‍රලාභී වාණිජ බැංකුවල ශුද්ධ විදේශීය වත්කම් ඉහළ ගියේය. මෙම කාල සීමාව තුළ දී, විදේශීය බැංකුවල තැන්පතු සහ අනේවාසිකයන්ට ණය ලබා දීම ඉහළ යෑම මෙන්ම, විදේශීය බැංකුවලින් ලබා ගත් ණය පහළ යෑම, අක්වෙරළ බැංකු ඒකකවල ශුද්ධ විදේශීය වත්කම් ඉහළ යෑමට හේතු විය. කෙසේ වෙතත්, විදේශීය බැංකුවලින් ණය ලබා ගැනීම් වැඩි වීම සහ විදේශ සේවානියුක්තිකයන්ගේ ප්‍රේෂණවල සැලකිය යුතු ප්‍රසාරණය හේතුවෙන් අනේවාසිකයින්ගේ තැන්පතු ඉහළ යෑමෙහි ප්‍රතිඵලයක් ලෙස, දේශීය බැංකු ඒකකවල ශුද්ධ විදේශීය වත්කම් පහළ ගියේය.

**රාජ්‍ය අංශය වෙත සපයන ලද ණය ඉහළ යෑම හේතුවෙන් බැංකු පද්ධතියේ ශුද්ධ දේශීය වත්කම් 2020 වසර තුළ දී සැලකිය යුතු ලෙස ප්‍රසාරණය විය.** ශුද්ධ දේශීය වත්කම් සැලකීමේ දී, 2020 වසර තුළ දී රජය වෙත සපයන ලද ශුද්ධ ණය රුපියල් බිලියන 1,752.1කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. විදේශ මූල්‍යයනය සඳහා වූ සීමිත ප්‍රවේශය සහ රජයේ ආදායම පහත වැටීම මධ්‍යයේ රජයේ දේශීය මූල්‍යයනය ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, අතිරික්ත ද්‍රවශීලතාවක් පවතින වාතාවරණයක් තුළ රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීම සඳහා බැංකු වැඩි කැමැත්තක් දැක් වූ අතර, වසංගත තත්ත්වය මධ්‍යයේ පෞද්ගලික අංශය වෙත ණය ලබා දීමේ දී වඩාත් සැලකිලිමත් විය. ඒ අනුව, භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජනය මෙන්ම, රජයේ අයිරා ශේෂයන් ඉහළ යෑම හේතුවෙන් 2020 වසර තුළ දී

**7.13 රූප සටහන**

**දේශීය ණයෙහි වාර්ෂික ඉහළ යෑම**





මූලයː ශ්‍රී ලංකා මහ බැංකුව

බලපත්‍රලාභී වාණිජ බැංකු මගින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය රුපියල් බිලියන 1,246.3කින් ඉහළ ගියේය. මේ අතර, වසංගත තත්ත්වය හේතුවෙන් ඇති වූ රජයේ හදිසි අරමුදල් අවශ්‍යතා සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රාථමික වෙන්දේසිවල දී රජයේ සුරැකුම්පත් ශුද්ධ පදනමින් මිලදී ගැනීම හේතුවෙන්, 2020 වසර තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය රුපියල් බිලියන 505.9කින් ඉහළ ගියේය. 2020 අයවැය ඇස්තමේන්තු සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ලැබීමෙන් පසු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රජයට ලබා දුන් තාවකාලික අත්තිකාරම් ප්‍රමාණය, 2020 නොවැම්බර් මාසය අවසානයේ පැවති රුපියල් බිලියන 237.8 සිට 2020 වසර අවසානය වන විට රුපියල් බිලියන 153.1ක් දක්වා පහළ ගියේය.

**වසංගත තත්ත්වය හේතුවෙන් රජය සතු වාණිජ ව්‍යාපාර බොහොමයක මූල්‍ය තත්ත්වය දුර්වල වීම පිළිඹිමු කරමින් රජය සතු වාණිජ ව්‍යාපාර වෙත බැංකු පද්ධතිය විසින් ලබා දුන් ණය, 2020 වසර තුළ දී සැලකිය යුතු ඉහළ යෑමක් වාර්තා කළේය.** ඒ අනුව, 2020 වසර තුළ දී රජය සතු වාණිජ ව්‍යාපාර, බැංකු පද්ධතියෙන් ලබා ගත් ණය ප්‍රමාණය රුපියල් බිලියන 184.2කින් ඉහළ ගියේය. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව බැංකු පද්ධතියෙන් විදේශ ව්‍යවහාර මුදල් ලෙස ලබා ගත් ණය රුපියල් බිලියන 74කින් පමණ ඉහළ ගිය ද, 2020 වසර තුළ දී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව බැංකු පද්ධතිය තුළ ඉහළ රුපියල් තැන්පතු ප්‍රමාණයක් පවත්වා ගෙන යන ලදී. මේ අතර, 2020 වසර තුළ දී මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ලබා ගත් බැංකු ණය ප්‍රමාණය රුපියල් බිලියන 53.6කින් ඉහළ ගියේය. මීට අමතරව, ශ්‍රීලන්කන් ගුවන් සේවය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව, වී අලෙවි මණ්ඩලය සහ ලංකා විදුලිබල මණ්ඩලය විසින් ලබා ගන්නා ලද ණය ප්‍රමාණය 2020 වසර තුළ දී ඉහළ ගිය අතර, ශ්‍රී ලංකා වරාය අධිකාරිය වසර තුළ දී එහි වගකීම් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නැවත පියවා ඇත.

**වසංගතයෙන් සැලකිය යුතු ලෙස බලපෑමට ලක්වූ පෞද්ගලික අංශයට, බැංකු පද්ධතියෙන් සපයන ලද ණය, ලිහිල් මුදල් තත්ත්වයේ සහායයෙන් 2020 අගෝස්තු මාසයේ සිට ක්‍රමයෙන් ඉහළ යෑමක් වාර්තා කළේය.** 2019 වසරේ දී අඩු වර්ධනයක් වාර්තා කිරීමෙන් අනතුරුව බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට සපයන ලද ණය වර්ධනය 2020 පළමු කාර්තුවේ දී යම් යථා තත්ත්වයට පත්වීමක් දක්නට ලැබුණු ද, කොවිඩ්-19 වසංගතය ව්‍යාප්ත වීම

**7.14 රූප සටහන**
**වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය**



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

හා ඒ හා සම්බන්ධ සංචරණ සීමා පැනවීමේ පියවර හේතුවෙන් එම වර්ධනය අඩාල විය. මුදල් වෙළඳපොළ තුළ ඉහළ ද්‍රවශීලතා මට්ටමක් සහ සාපේක්ෂව අඩු වෙළඳපොළ පොලී අනුපාතික පැවතිය ද, වසංගත තත්ත්වය තුළ ණය ලබා දීමේ දී බැංකු අනුගමනය කළ අවදානම් මග හැරීමේ ප්‍රවණතාවය හේතුවෙන් ණය සැපයීම සීමා කිරීමත් සමඟ 2020 අප්‍රේල් මාසයේ සිට ණය ප්‍රසාරණය පහළ මට්ටමක පැවතිණි. කෙසේ වෙතත්, ඉතිහාසයේ මෙතෙක් පැවති අවම මට්ටම දක්වා පොලී අනුපාතික අඩු වීම මෙන්ම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහනදායී ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම ඇතුළු ලිහිල් මුදල් ප්‍රතිපත්ති තත්ත්වයට ප්‍රතිචාර වශයෙන් 2020 අගෝස්තු මාසයේ සිට පෞද්ගලික අංශයට සපයන ලද ණය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වීමක් දක්නට ලැබුණි. ඒ අනුව, 2020 වසර අවසානය වන විට පෞද්ගලික අංශයට සපයන ලද ණය සියයට 6.5ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කරමින් වසර තුළ දී රුපියල් බිලියන 374.1කින් ඉහළ ගියේය.

**පෞද්ගලික ණය සහ අත්තිකාරම් ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතුවෙමින්, 2020 වසරේ දෙවන භාගයේ දී පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය ඉහළ ගිය අතර, වසර තුළ දී ආර්ථිකයේ කෘෂිකාර්මික, කර්මාන්ත හා සේවා අංශවල ක්‍රියාකාරකම් සඳහා ලබා දුන් ඍජු ණය අඩු මට්ටමක පැවතුණි.** වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය සහ අත්තිකාරම් පිළිබඳ කාර්තුමය සමීක්ෂණයට අනුව, 2020 වසර අවසානය වන විට පෞද්ගලික ණය සහ අත්තිකාරම් ලෙස ලබා දුන් ණය වර්ධනය

7

### 7.6 සංඛ්‍යා සටහන
### වාණිජ බැංකු විසින් ලබා දුන් ණය සහ අත්තිකාරම්හි ආංශික වර්ගීකරණය (අ) (ආ)

රුපියල් බිලියන

| අංශය | 2019 අවසානයට | 2020 අවසානයට (ඇ) | 2020 දායකත්වය (%) | 2020 ප්‍රතිශතක වෙනස |
|---|---|---|---|---|
| **කෘෂිකාර්මික සහ ධීවර** | **471.1** | **489.7** | **7.7** | **3.9** |
| එයින්, තේ | 95.8 | 102.0 | 1.6 | 6.4 |
| රබර් | 25.9 | 30.8 | 0.5 | 19.0 |
| පොල් | 24.7 | 27.8 | 0.4 | 12.7 |
| වී | 38.0 | 38.6 | 0.6 | 1.4 |
| එළවළු, පලතුරු සහ සුළු ආහාර භෝග | 30.8 | 29.2 | 0.5 | -5.3 |
| ධීවර | 21.5 | 20.5 | 0.3 | -4.6 |
| **කර්මාන්ත** | **2,427.0** | **2,540.1** | **39.8** | **4.7** |
| එයින්, ඉදිකිරීම් | 1,197.6 | 1,348.6 | 21.1 | 12.6 |
| ආහාර සහ පාන වර්ග | 130.8 | 148.3 | 2.3 | 13.4 |
| රෙදිපිළි සහ ඇඟලුම් | 214.6 | 235.1 | 3.7 | 9.5 |
| සකස්කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර-සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 192.3 | 132.9 | 2.1 | -30.9 |
| **සේවා** | **1,692.8** | **1,716.7** | **26.9** | **1.4** |
| එයින්, තොග සහ සිල්ලර වෙළෙඳාම | 502.4 | 501.8 | 7.9 | -0.1 |
| සංචාරක ව්‍යාපාරය | 235.1 | 261.7 | 4.1 | 11.3 |
| මූල්‍ය සහ ව්‍යාපාරික සේවා | 370.6 | 350.1 | 5.5 | -5.5 |
| නාවික, ගුවන් සහ භාණ්ඩ නිෂ්කාශනය | 27.2 | 21.6 | 0.3 | -20.6 |
| **පෞද්ගලික ණය සහ අත්තිකාරම් (ඈ)** | **1,418.5** | **1,632.1** | **25.6** | **15.1** |
| එයින්, කල්පවත්නා පාරිභෝගික භාණ්ඩ | 239.1 | 330.8 | 5.2 | 38.4 |
| උකස් ණය | 211.0 | 248.7 | 3.9 | 17.9 |
| ණය කාඩ්පත් | 131.0 | 127.8 | 2.0 | -2.5 |
| **එකතුව (ඉ)** | **6,009.4** | **6,378.6** | **100.0** | **6.1** |

(අ) වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය සහ අත්තිකාරම් පිළිබඳ කාර්තුමය සමීක්ෂණය මත පදනම් වේ.

(ආ) ණය සහ අත්තිකාරම්වලට අයිරා සහ වට්ටම් කළ බිල්පත් ඇතුළත් වන අතර එකතු වෙමින් පවත්නා මුදල් ශීර්ෂ ඇතුළත් නොවේ.

(ඇ) තාවකාලික

(ඈ) 'කර්මාන්ත' යටතේ වර්ගීකරණය කර ඇති 'ඉදිකිරීම්' කාණ්ඩයට අයත්වන පෞද්ගලික නිවාස ණය ඉවත්කර ඇති අතර ආරක්ෂණ ජාල ආශ්‍රිත ණය ක්‍රම මගින් ලබාදෙන ණය ඇතුළත් වේ.


(ඉ) ගණනය කිරීමේ ක්‍රමවේදයන්හි වෙනස්කම් හේතුවෙන්, කාර්තුමය සමීක්ෂණයට අනුව පෞද්ගලික අංශය වෙත සපයන ලද සමස්ත ණය, මුදල් සමීක්ෂණයේ ඇති එම අගයට වඩා වෙනස් වේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 15.1ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. පෞද්ගලික ණය සහ අත්තිකාරම් තුළ, කල් පවත්නා පාරිභෝගික භාණ්ඩ උප අංශය යටතේ වූ ණය, 2020 වසර අවසානය වන විට වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 38.4ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. මේ අතර, උකස් අත්තිකාරම් මත වූ උපරිම පොලී අනුපාතික අඩු කිරීම සහ රන් මිල ඉහළ යෑමත් සමඟ එවැනි ණය සඳහා වැඩි වශයෙන් යොමු වීම පිළිබිඹු කරමින්, උකස් අත්තිකාරම් මත ලබා දී ඇති ණය, 2020 වසර අවසානය වන විට වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 17.9කින් වර්ධනය විය. කෙසේ වෙතත්, ණය කාඩ්පත් අත්තිකාරම් වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2019 වසර අවසානයේ දී පැවති සියයට 22.9ක වර්ධනය හා සැසඳීමේ දී 2020 වසර අවසානය වන විට සියයට 2.5කින් අඩු විය. මේ අතර, කෘෂිකාර්මික හා ධීවර අංශයට ලබා දුන් ණය 2020 වසර අවසානය වන විට වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 3.9ක අඩු වර්ධනයක් වාර්තා කළේය. මෙම අංශය තුළ, තේ, වී, රබර් සහ පොල් උප අංශ සඳහා ණය ප්‍රවාහයන් 2020 වසරේ දී ඉහළ ගිය අතර, එළවළු, පලතුරු වගාව හා සුළු ආහාර භෝග, සහ ධීවර යන උප අංශ සඳහා ණය ලබා දීම්, 2019 වසරේ අවසානය හා සැසඳීමේ දී 2020 වසරේ දී අඩු විය. මේ අතර, 2020 වසර අවසානය වන විට කර්මාන්ත අංශයට ලබා දුන් ණය වර්ධනය, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, 2019 වසර අවසානයේ වූ සියයට 3.1 සිට 2020 වසර අවසානය වන විට සියයට 4.7ක් දක්වා ඉහළ ගියේය. 2020 වසරේ මුල් කාලයේ දී කොවිඩ්-19 වසංගතය ආශ්‍රිත සංචරණ සීමා හේතුවෙන් බලපෑමට ලක් වූ ඉදිකිරීම් අංශය, අඩු පොලී අනුපාතිකවල සහාය ඇතිව සැලකිය යුතු ලෙස යථා තත්වයට පත් විය. ඒ අනුව, කර්මාන්ත අංශය තුළ, කර්මාන්ත අංශයට ලබා දුන් සමස්ත ණය ප්‍රමාණයෙන් සියයට 53ක් පමණ වූ ඉදිකිරීම් උප අංශයට ලබා දෙන ණය, 2020 වසර අවසානය වන විට, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 12.6ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. රෙදිපිළි හා ඇඟලුම් සහ ආහාර හා පාන වර්ග

7

**7.15 රූප සටහන**
**ප්‍රධාන අංශවලට ලබා දුන් පෞද්ගලික අංශයේ ණයවල වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය (සියයට)**



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

යන අනෙකුත් උප අංශ සඳහා ලබා දෙන ණය ද, 2020 වසර අවසානය වන විට සැලකිය යුතු ලෙස වර්ධනය විය. කෙසේ වෙතත්, සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර-සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ; රසායනික, ඛනිජ තෙල්, ඖෂධ හා සෞඛ්‍ය සේවා සහ රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදන; සහ ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදන යන උප අංශ 2019 වසරේ අවසානය හා සැසඳීමේ දී 2020 වසර අවසානය වන විට සැලකිය යුතු ලෙස අඩු විය. කොවිඩ්-19 වසංගතය පැතිරීම සහ එය පාලනය කිරීමට ගත් ක්‍රියාමාර්ග මෙන්ම, ආනයන සීමා කිරීම් හේතුවෙන් සමස්ත ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී වීම සේවා අංශයේ ක්‍රියාකාරකම් සඳහා ණය ලබා ගැනීමට ද බලපාන ලදී. ඒ අනුව, සේවා අංශයට ලබා දී ඇති ණය වර්ධනය, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2019 වසරේ අවසානයේ දී වූ සියයට 3.1ක වර්ධනය හා සැසඳීමේ දී 2020 වසර අවසානය වන විට සියයට 1.4ක් දක්වා මන්දගාමී විය. 2020 වසර තුළ පෞද්ගලික මෝටර් රථ ආනයනය සීමා කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මධ්‍යයේ, සේවා අංශයට ලබා දුන් ණය මන්දගාමී වීමට දායක වෙමින්, මූල්‍ය සහ ව්‍යාපාර සේවා උප අංශයට ලබා දුන් ණය වර්ධනය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2019 වසර අවසානයේ දී වාර්තා වූ සියයට 6.5ක අඩු වීම හා සැසඳීමේ දී 2020 වසර අවසානය වන විට සියයට 5.5කින් අඩු විය. තවද, තොග හා සිල්ලර වෙළඳාම සහ නාවික, ගුවන් හා භාණ්ඩ නිෂ්කාශනය යන උප අංශ සඳහා ණය ලබා දීම් ද 2019 වසර අවසානයට සාපේක්ෂව 2020 වසර අවසානය වන විට අඩු වී ඇත. එසේ වුව ද, සංචාරක ආශ්‍රිත කර්මාන්ත සඳහා ලබා දී ඇති ණය ලිහිල් කිරීම් සහ වසංගතයෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාරවලට සහාය වීම සඳහා වූ විශේෂ සහන ණය යෝජනා ක්‍රම ඇතුළු අනෙකුත් ක්‍රියාමාර්ග මධ්‍යයේ සංචාරක උප අංශය යටතේ වූ ණය 2020

**7.7 සංඛ්‍යා සටහන**
**වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් සමස්ත ණය ශේෂයේ පරිණත කාල පිළිබඳ විශ්ලේෂණය (අ) (ආ)**

| අංශය | පරිණත කාලය | දෙසැම්බර් 2019 | | දෙසැම්බර් 2020 (ඇ) | |
|---|---|---|---|---|---|
| | | දායකත්වය (%) | වර්ධනය (%) | දායකත්වය (%) | වර්ධනය (%) |
| කෘෂිකාර්මික සහ ධීවර | කෙටි කාලීන | 4.8 | -1.2 | 4.5 | -1.7 |
| | මැදි කාලීන | 1.9 | 3.5 | 1.7 | -5.3 |
| | දිගු කාලීන | 1.1 | 1.3 | 1.5 | 44.0 |
| කර්මාන්ත | කෙටි කාලීන | 13.5 | -0.2 | 11.5 | -9.2 |
| | මැදි කාලීන | 9.0 | 1.2 | 8.5 | 0.1 |
| | දිගු කාලීන | 17.9 | 6.8 | 19.8 | 17.4 |
| සේවා | කෙටි කාලීන | 10.5 | -0.6 | 8.6 | -12.6 |
| | මැදි කාලීන | 9.2 | 1.9 | 9.1 | 4.3 |
| | දිගු කාලීන | 8.5 | 9.8 | 9.2 | 15.6 |
| පෞද්ගලික ණය සහ අත්තිකාරම් | කෙටි කාලීන | 10.2 | 14.5 | 9.2 | -3.6 |
| | මැදි කාලීන | 5.3 | 10.5 | 5.5 | 10.4 |
| | දිගු කාලීන | 8.1 | 9.7 | 10.8 | 41.5 |
| එකතුව | කෙටි කාලීන | 39.0 | 3.0 | 33.9 | -7.7 |
| | මැදි කාලීන | 25.5 | 3.4 | 24.8 | 5.5 |
| | දිගු කාලීන | 35.6 | 8.0 | 41.3 | 23.3 |

(අ) වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය සහ අත්තිකාරම් පිළිබඳ කාර්තුමය සමීක්ෂණය මත පදනම් වේ.
(ආ) මූලික කල්පිරීම පදනම් කරගනිමින් ණය වර්ගීකරණය සිදුකර ඇති අතර එය වසරකට වඩා අඩු-කෙටි කාලීන, වසර 1-5 අතර-මැදි කාලීන හා වසර පහකට වඩා වැඩි-දිගු කාලීන වශයෙන් දක්වා ඇත.
(ඇ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


7

වසර අවසානය වන විට ඉහළ ගියේය. තව ද, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දී ඇති ණය කල්පිරීමේ කාලය අනුව සලකා බැලීමේ දී කෙටි කාලීන ණය පහසුකම්වල අඩුවීමක් දක්නට ලැබුණු අතර, අඩු පොලී අනුපාතිකවලින් ප්‍රතිලාභ ලබා ගැනීමට ණය කළඹෙහි දිගු කාලීන කල්පිරීම් සඳහා පාරිභෝගික යොමු වීම පෙන්නුම් කරමින්, මැදි සහ දිගු කාලීන ණය පහසුකම්වල වැඩි වීමක් දක්නට ලැබුණි. සමස්තයක් වශයෙන්, 2020 වසරේ දී පෞද්ගලික ණය හා අත්තිකාරම්වල ඉහළ යෑම, පෞද්ගලික අංශයට ලබා දී ඇති ණය ප්‍රසාරණය සඳහා සියයට 58කින් පමණ දායක වූ අතර, කර්මාන්ත, සේවා සහ කෘෂිකාර්මික හා ධීවර යන අංශ සඳහා වූ ණය ඉහළ යෑම, පෞද්ගලික අංශයට ලබා දී ඇති ණය ප්‍රසාරණය සඳහා, පිළිවෙලින්, සියයට 31කින්, සියයට 6කින්, සහ සියයට 5කින් පමණ දායක විය. ආර්ථිකයේ ඵලදායී අංශ සඳහා වූ ණය ප්‍රසාරණය ප්‍රමාණවත් නොවූ හෙයින්, ශ්‍රී ලංකා මහ බැංකුව, බැංකු ප්‍රජාවේ ද සහාය ඇතිව, ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයෙහි ප්‍රමුඛ අංශවලට ණය ලබා දීමේ ඉලක්ක හඳුන්වා දීම පිළිබඳව 2021 ජනවාරි මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලදී.

### පුළුල් මුදල් සැපයුම ($M_4$)

**මූල්‍ය සමීක්ෂණය[13] මගින් මනිනු ලබන පුළුල් මුදල් සැපයුමේ ($M_4$) වර්ධනය බලපත්‍රලාභී බැංකුවල ශුද්ධ දේශීය වත්කම් ප්‍රසාරණය වීම හේතුවෙන්, 2020 වසර අවසානය වන විට, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 21.4ක් දක්වා ඉහළ ගියේය.** $M_4$ පුළුල් මුදල් සැපයුමේ වත්කම් අංශයෙන් සලකා බලන විට, ශුද්ධ දේශීය වත්කම් ප්‍රසාරණය සඳහා දායක වෙමින්, බලපත්‍රලාභී විශේෂිත බැංකුවල දේශීය ණය ප්‍රමාණය 2020 වසර තුළ දී රුපියල් බිලියන 250.7කින් ඉහළ ගිය අතර, බලපත්‍රලාභී මුදල් සමාගම්වල දේශීය ණය ප්‍රමාණය රුපියල් බිලියන 2.8ක පහළ යෑමක් වාර්තා විය. $M_4$ පුළුල් මුදල් සැපයුමේ දේශීය වත්කම් තුළ, රජය වෙත ලබා දුන් ශුද්ධ ණය ප්‍රමාණය 2020 වසර තුළ දී රුපියල් බිලියන 1,882.8කින් සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් මගින් රජයට ලබා දුන් ශුද්ධ ණය, පිළිවෙලින්, රුපියල් බිලියන 128.4කින් සහ රුපියල් බිලියන 2.3කින් ඉහළ ගියේය. $M_4$ පුළුල් මුදල් සැපයුමට අනුව, පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය ප්‍රමාණය 2020 වසර තුළ දී රුපියල් බිලියන 491.3කින් ඉහළ ගිය අතර, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2019 වසර අවසානයේ වාර්තා වූ සියයට 3.9ක වර්ධනය හා සැසඳීමේ දී, 2020 වසර අවසානය වන විට සියයට 6.3ක වර්ධනයක් වාර්තා කළේය. $M_4$ පුළුල් මුදල් සැපයුමට අනුව පෞද්ගලික අංශය වෙත සපයන ලද මුළු ණය ප්‍රසාරණයට සියයට 25ක පමණ දායකත්වයක් ලබා දෙමින්, බලපත්‍රලාභී විශේෂිත බැංකු මගින් පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය 2020 වසරේ දී සියයට 15ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කරමින්, රුපියල් බිලියන 122.3කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. කෙසේ නමුත්, බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය ප්‍රමාණය, 2020 වසරේ දී රුපියල් බිලියන 5.1කින් අඩු වීමේ ප්‍රතිඵලයක් ලෙස, වසර අවසානය වන විට සියයට 0.4ක වාර්ෂික ලක්ෂ්‍යමය සංකෝචනයක් වාර්තා කළේය. වාහන ආනයනය සඳහා පනවා ඇති සීමාවන් හේතුවෙන් වාහන ආශ්‍රිත ණය ලබා දීම මන්දගාමී වීම සහ බැංකු නොවන මූල්‍ය අංශයේ අක්‍රීය ණය ඉහළ යෑම හේතුවෙන් අවදානම් මග හැරීමේ ප්‍රවණතාව මේ සඳහා හේතු විය හැකිය. 2020 වසරේ දී $M_4$ පුළුල් මුදල් සැපයුමේ සමස්ත ශුද්ධ විදේශීය වත්කම් ප්‍රමාණය පහළ ගිය ද, විදේශීය වගකීම් අඩු වීම හේතුවෙන් බලපත්‍රලාභී විශේෂිත බැංකුවල ශුද්ධ විදේශීය වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 4.3කින් ඉහළ ගියේය. $M_4$ පුළුල් මුදල් සැපයුමේ වගකීම් අංශයෙන් සලකා බලන විට, 2020 වසර අවසානයේ දී මහජනතාව සතු සමස්ත කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතු, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම

**7.16 රූප සටහන**
**මුදල් සමස්තවල වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

13 මූල්‍ය සමීක්ෂණය ද්‍රවශීලතාව පිළිබඳව වඩාත් පුළුල් මිනුමක් වන අතර, එයට ශ්‍රී ලංකා මහ බැංකුව සහ බලපත්‍රලාභී වාණිජ බැංකු මෙන්ම, බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් ද ඇතුළත් වේ.

7

**7.8 සංඛ්‍යා සටහන**

**පුළුල් මුදල් ($M_4$) සැපයුමෙහි වත්කම් අංශය**
**(මූල්‍ය සමීක්ෂණය අනුව ගණනය කරන ලදී)**

රුපියල් බිලියන

| අයිතමය | 2019 අවසානයට (අ) | 2020 අවසානයට (ආ) | වෙනස | | | |
|---|---|---|---|---|---|---|
| | | | 2019 | | 2020 | |
| | | | ප්‍රමාණය | % | ප්‍රමාණය | % |
| **පුළුල් මුදල් ($M_4$)** | **9,444.5** | **11,461.9** | **714.9** | **8.2** | **2,017.4** | **21.4** |
| **තුඩුදුන් සාධක** | | | | | | |
| **ශුද්ධ විදේශීය වත්කම්** | **88.8** | **-217.1** | **222.4** | **166.4** | **-305.9** | **-344.6** |
| මුදල් අධිකාරීන් (ඇ) | 896.0 | 526.8 | 145.5 | 19.4 | -369.2 | -41.2 |
| බලපත්‍රලාභී වාණිජ බැංකු | -795.3 | -736.2 | 22.3 | 2.7 | 59.0 | 7.4 |
| බලපත්‍රලාභී විශේෂිත බැංකු | -11.9 | -7.6 | 54.7 | 82.1 | 4.3 | 36.0 |
| **ශුද්ධ දේශීය වත්කම්** | **9,355.8** | **11,679.0** | **492.5** | **5.6** | **2,323.2** | **24.8** |
| **දේශීය ණය** | **12,094.2** | **14,652.4** | **737.6** | **6.5** | **2,558.3** | **21.2** |
| **රජයට ලබා දුන් ශුද්ධ ණය** | **3,483.0** | **5,365.7** | **382.9** | **12.4** | **1,882.8** | **54.1** |
| මහ බැංකුව | 363.0 | 868.9 | -109.8 | -23.2 | 505.9 | 139.3 |
| බලපත්‍රලාභී වාණිජ බැංකු | 2,432.9 | 3,679.2 | 389.0 | 19.0 | 1,246.3 | 51.2 |
| බලපත්‍රලාභී විශේෂිත බැංකු | 613.9 | 742.2 | 95.3 | 18.4 | 128.4 | 20.9 |
| බලපත්‍රලාභී මුදල් සමාගම් | 73.2 | 75.5 | 8.4 | 13.0 | 2.3 | 3.1 |
| **රාජ්‍ය සංස්ථාවලට ලබා දුන් ණය (බලපත්‍රලාභී වාණිජ බැංකු)** | **818.0** | **1,002.2** | **62.6** | **8.3** | **184.2** | **22.5** |
| **පෞද්ගලික අංශයට ලබා දුන් ණය** | **7,793.3** | **8,284.5** | **292.1** | **3.9** | **491.3** | **6.3** |
| බලපත්‍රලාභී වාණිජ බැංකු | 5,796.9 | 6,170.9 | 235.5 | 4.2 | 374.1 | 6.5 |
| බලපත්‍රලාභී විශේෂිත බැංකු | 814.2 | 936.5 | 60.3 | 8.0 | 122.3 | 15.0 |
| බලපත්‍රලාභී මුදල් සමාගම් | 1,182.2 | 1,177.1 | -3.7 | -0.3 | -5.1 | -0.4 |
| **අනෙකුත් අයිතම (ශුද්ධ) (ඈ)** | **-2,738.4** | **-2,973.4** | **-245.1** | **-9.8** | **-235.1** | **-8.6** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් මෙන්ම රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් වාර්තා කරනු ලබන රජයේ රන් පවුම් ශේෂය ද මෙහි අන්තර්ගත වේ.
(ඈ) අනෙකුත් වත්කම් සහ අනෙකුත් වගකීම් අතර වෙනස මගින් ගණනය කරනු ලැබේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

මත 2019 වසර අවසානයේ දී වූ සියයට 8.5ක වර්ධනය හා සැසඳීමේ දී, 2020 වසර අවසානය වන විට සියයට 20.0කින් වර්ධනය විය. බලපත්‍රලාභී විශේෂිත බැංකු වෙතැති කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතු, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2019 වසර අවසානයේ දී වූ සියයට 17.8ක වර්ධනය හා සැසඳීමේ දී 2020 වසර අවසානය වන විට සියයට 21.6කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. කෙසේ නමුත්, මුදල් සමාගම් කිහිපයක බලපත්‍ර සහ ව්‍යාපාර කටයුතු අත්හිටුවීමෙහි බලපෑම මෙන්ම, වසංගත තත්ත්වය හමුවේ ඉහළ ගිය අවිනිශ්චිතතා හේතුවෙන් බලපත්‍රලාභී මුදල් සමාගම් වෙතින් බැංකු අංශය වෙත ක්‍රමයෙන් තැන්පතු මාරු කිරීම පිළිබිඹු කරමින්, බලපත්‍රලාභී මුදල් සමාගම් සතු කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතු වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2019 වසර අවසානයේ දී වාර්තා කළ සියයට 4.9ක වර්ධනය හා සැසඳීමේ දී, 2020 වසර අවසානය වන විට සියයට 0.7කින් සුළු වශයෙන් සංකෝචනය විය.

7